# මාසික මහ සභා රැස්වීම - 2022/09/13 දින

## අලව්ව ප්‍රාදේශීය සභාව

2022/09/13 වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 54 වන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා**

1. ගරු සභාපතිනි - පද්මා වැත්තැව මැතිනිය
2. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ජයතිලක මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා

**මෙදින මහ සභාවට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 54 වන මහ සභා රැස්වීමට සපැමිණි අපේ සියලුම මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාත් අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ප්‍රධාන කොටගත් එම නිළධාරීන් ඇතුළු සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

## 01. 2022/08/09 දින මහ සභා වාර්තාව ස්ථිර කිරිම.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

2022.08.09 දින මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තාව ස්ථිර කිරිමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2022.08.09 දින පැවති VI වන සැසිවාරයේ 53 වන මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව ස්ථිර කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම වාර්තාව ඉතාම හොඳ වාර්තාවක් ලෙස සභාගත වීම පිළිබඳව අපි පොඩි ඇගයීමක් කල යුතුයි. ඒ පිළිබඳව කටයුතු කල ලේකම්තුමිය ඇතුළු සියළුම නිලධාරීන්ට අපි ප්‍රණාමය පුද කර සිටිනවා.

**මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන - නැත**

## 02. ගරු සභාපතිතුමිය විසින් කරනු ලබන විශේෂ නිවේදන

### 02.1 2023 වර්ෂය සදහා අයවැය සකස් කිරිම.

2023 වර්ෂය සදහා අයවැය සකස් කිරිම සම්බන්ධයෙන් වන සාකච්ඡාවක් 2022/09/23 දින පෙ.ව 10.00 ඔබතුමන්ලා ඔබතුමියන්ලාගේ ප්‍රධානත්වයෙන් අලව්ව නගර ශාලාවේදී පැවැත්වීමට නියමිතයි. අදාල ලිපි මේ වන විටත් ඔබතුමන්ලා වෙත ලැබී ඇති. එදින අපි අයවැය සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අදහස් අරගෙන සාකච්ඡා කරල අයවැය සකස් කරන්න බලාපොරොත්තු වෙනවා. සියළුම දෙනාම අනිවාර්යෙන් ඒ සදහා සහභාගී වන ලෙස ඉල්ලා සිටිනවා.

### 02.2 ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම හා නෙට්බෝල් කණ්ඩායම ආසියානු කුසලාන තරඟාවලියෙන් ශූරතාව දිනාගැනීම.

ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම හා නෙට්බෝල් කණ්ඩායම ආසියානු කුසලාන තරඟාවලියෙන් ශූරතාව දිනාගැනීම පිළිබඳ අලව්ව ප්‍රාදේශීය සභාවේ ගෞරවය හා සතුට ප්‍රකාශ කරන බව සිහිපත් කරනවා.

### 02.3 ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනියගේ විශේෂ නිවේදනය

ඔබතුමාලා දැනුවත් කලා අන්තර් පළාත් පාලන විවාද තරඟාවලියක් තියන බවට. ඒ අනුව ඔබතුමාලට දැනුවත් කර මූලික වටයේ තරඟය සඳහා සහභාගී වූ මන්ත්‍රීවරුන්ගෙන් කිහිපදෙනෙක් සියළු පක්ෂ නියෝජනය වන ආකාරයට ඉදිරිපත් කලා. ඒ අනුව අපට ලැබුණු මාතෘකාව වුයේ “ පළාත් පාලන ආයතනයක ප්‍රධාන තනතුරු දැරීම සඳහා අවම අධ්‍යාපන සුදුසුකමක් අනිවාර්ය කිරිම යෝග්‍ය වේ ” යන්නයි. ප්‍රතියෝජක කණ්ඩායම වූ වැලිගම ප්‍රාදේශීය සභාවට ලැබුණු මාතෘකාව “ පළාත් පාලන ආයතනයක ප්‍රධාන තනතුරු දැරීම සඳහා අවම අධ්‍යාපන සුදුසුකමක් අනිවාර්ය කිරිම යෝග්‍ය නොවේ ” යන්නයි. අපි ඉදිරිපත් වුණු මන්ත්‍රීතුමන්ලාත් එක්ක ජාතික පාසලේ විවාද කණ්ඩායමත් එක්ක පොඩි විවාදයක් තියල පොඩි පුහුණුවක් ලබාගෙන පසුව තරඟය පැවැත්වුවා. අපට දැනගන්න ලැබුණ විදිහට නම් අපේ විවාද කණ්ඩායම එහි ඉදිරියෙන් සිටිනවා. ලේකම්තුමිය ප්‍රධාන ප්‍රජා සංවර්ධන අංශයේ නිලධාරි මහත්ම මහත්මීන්ටත් සහභාගී වුන ගරු මන්ත්‍රීතුමන්ලාටත් ස්තුතිය හා ගෞරවය පුද කරනවා. ඔබතුමාලට අවශ්‍ය නම් සභාව අවසානයේ එය නැරඹීමට හැකියාව තිබෙනවා.

**03.** **ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.**

**03.1 අලව්ව නාරම්මල ප්‍රධාන මාර්ගයේ සමූපාකාර තොග ගබඩාව සහ සරසවි සිනමාහල අසල පිහිටි රජය සතු ඉඩම සම්බන්ධවයි.**

පසුගිය සභාවේදී අලව්ව නගරය සුරකීමේ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද අලව්ව නාරම්මල ප්‍රධාන මාර්ගයේ සමූපාකාර තොග ගබඩාව සහ සරසවි සිනමාහල අසල රජය සතු ඉඩමක අනවසර අල්ලා ගැනීමක් සම්බන්ධයෙන් යොමුකළ ලිපිය සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේද අදහස් ලබාගෙන එසේ අනවසර අල්ලා ගැනීමක් තිබේද යන්න තහවුරු කරගැනීම සඳහා 2022.08.08 දිනැතිව අප සභාව විසින් ප්‍රාදේශීය ලේකම්තුමිය වෙත ලිපියක් යොමුකරන ලද අතර ඒ සඳහා එතුමිය විසින් 2022/08/23 වන දින අප වෙත ලිපියක් යොමුකරමින් මේ සම්බන්ධයෙන් සොයා බලා තහවුරු කරගැනිම සඳහා මැනුම් ඉල්ලීමක් පළාත් ඉඩම් කොමසාරිස් වෙත යවා ඇති බව දන්වමින් පිළිතුරු ලිපියක් යොමුකර තිබෙනවා. එය ඔබතුමන්ලාගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**03.2 නාගරික සංවර්ධන අධිකාරියේ උපදේශන සේවා ලබා ගැනීම සම්බන්ධව.**

අප සභාව තුල ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිත යෝජිත ව්‍යාපෘති සඳහා නිර්මාණාත්මක උපදේශන සේවා ලබාගැනීමට උනන්දුවක් දක්වන්නේ නම් නාගරික සංවර්ධන අධිකාරියේ උපදේශන සේවා සහනදායී සේවා ගාස්තු මත ලබා දීමට හැකිබවත් එලෙස උපදේශන සේවා ලබාගන්නනේ නම් අදාළ ව්‍යාපෘති යෝජනා සමඟ නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමු කරන ලෙස දැනුම් දෙමින් නාගරික සංවර්ධන අධිකාරියේ වයඹ පළාත් අධ්‍යක්ෂ විසින් යොමු කර ඇති ලිපිය ඔබතුමන්ලාගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරනව.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඔබතුමිය නාගරික සංවර්ධන අධිකාරියේ නීති අධ්‍යක්ෂවරයාගෙන් ඉල්ලීමක් කරන්න. අපේ සභා බල ප්‍රදේශයේ සභාව සතු ඉඩම් අල්ලන්න සභාවත් එක්ක නඩු කියන උදවිය අනවසර ඉදිකිරීම් කරගෙන යනවා. මේ ඉදිකිරීම් කල කිසිම වෙලාවක අපි සභාවක් ලෙස ක්‍රියාකලේ නෑ. මේ සඳහා නීතිමය පියවරක් නොගැනීම නිසා අපේ නිලධාරීන් එය සිදු කරන්න එපා කියලා නවත්තන්න ගිය විට නිලධාරීන්ට බැන වැදිලා ඔවුන් මේ කටයුත්ත අඛණ්ඩව කරගෙන යනවා. එම නිසා නාගරික සංවර්ධන අධිකාරියේ මැදිහත්වීමෙන් අධිකරණය හරහා මෙම කටයුත්ත සිදුකර දෙන ලෙසට ද නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීමක් කරන්න.

**03.3 ක්ෂුද්‍ර ණය සේවාව පිළිබඳ තොරතුරු රැස් කිරීම.**

ක්ෂුද්‍ර ණය ලබාදීම තුලින් ජනතාවගේ දියුණුව අපේක්ෂා කලද වර්තමානයේ මෙම ක්‍රියාවලියේ විවිධ ගැටළු මතුවී ඇති බව සමාජය පිළිබඳ නිරීක්ෂණයේදී පැහැදිලි වේ. එබැවින් මෙසේ විවිධ ගැටළු වලට මැදිහත් වන ජනතාව දෙස සානුකම්පිතව සොයා බැලීම අරමුණු කරගත් වැඩපිළිවෙලක් පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කිරීමට අදහස් කර ඇති බවත් ඔබගේ බල ප්‍රදේශය තුල මෙවන් ගැටළු නිරීක්ෂණය වී ඇතිද යන්න සහ මෙවැනි ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වන්නේද යන්න සොයා බලා වාර්තා කරන ලෙසත් දන්වමින් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් අප වෙත ලිපියක් යොමුකරල තිබෙනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ බලප්‍රදේශවල ගැටළු ඇත්නම් අප වෙත යොමු කරන ලෙස සියළුදෙනා වෙතම දන්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි වැඩි ඈතකට යන්න අවශ්‍යා නෑ. මගේ කොට්ඨාශය නියෝජනය කරපු අමිල මන්ත්‍රීතුමා, එතුමා දැන් ඉන්නේ ජපානයේ. මැතිවරණය ඉවර වෙලා සති දෙකක් යනකොට එතුමාගේ නිවස ඩෝසර් කලා. ඔහු පොලියට මුදල් අරන් තිබුනා. ජපානයේ ව්‍යාපාර කරන්න. ඔහු ඒ මුදල් ගත් පුද්ගලයා අඩුම තරමේ ණය සහන මණ්ඩලයට ගිහින් මේක සාකච්ඡා කරලා ඉල්ලීම් කරන්න තිබුණා. එතුමා මේ ගරු සභාවේ මහජන නියෝජිතයෙක්. එම නිවස අද කාලේ වටිනාකමින් කෝටි 2 ½ ක විතර නිවසක්. මේක තමයි මේ පොලී මුදලාලිලාගේ ක්‍රියා කලාපය. මේ ක්‍රමවේදය තුල අඩුම තරමේ ණය සහන මණ්ඩලයට හරි යන්න තිබුනානම් මහ බැංකුවේ අනුමැතිය ගත්ත ණය ලබා දුන්න පුද්ගලයෙක් හැටියට මේක කතාකරලා විසඳගන්න තිබුනා. අවසානයේඅපි කතාකරලා අමිල මන්ත්‍රීතුමා එම ස්ථානයට යොමු කලාට පස්සේ අහලා තිබුනා ණය සහන මණ්ඩලයෙන් ඔබ මේ ණය ලබා ගත්තේ මහ බැංකුවේ අනුමැතිය ගත්ත පුද්ගලයෙක්ගෙන්ද කියලා. මේ ණය ක්‍රියාවලිය හේතුවෙන් ඇතැම් තැන්වල මේ ණය ලබාගත් පුද්ගලයන්ගේ පවුල් බිඳිල ගිහින් තිබෙනවා. මේ පළාත් පාලන විෂය තුල මේ අරන් තිබෙන තීරණය හොඳ තීරණයක්. මේ සඳහා නිවැරදිව දත්ත ලබා දීම කල යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,ඇත්තටම මෙය පළාත් පාලන ආයතනයෙන් අරන් තිබෙන හොඳ තීරණයක්. අපේ ගම්වලත් 90% ක් විතර පුද්ගලයන් මේ ණය අරන් තිබෙනවා. මේ පිළිබඳ අපේ සභාවෙන් ප්‍රචාරයක් ගිහින් දැනුවත් කර ඒ දත්ත ටික ගන්න පුළුවන් නම්  ගොඩක් හොඳයි. මෙම වාර්තාව ලබා දෙනකොට මුදල් එකතු කරන අයයි, මුදල් ලබා දෙන අයයි පිළිබඳව නිවැරදි දත්ත ලබා දෙනවා නම් හොඳයි කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඉතාම හොඳ කාලෝචිත යෝජනාවක්. අපි දැනුවත්ව අපේ ගම්වලත් සමහර අය රත්තරන් බඩු උකස් තියලා මුදල් දීලා බේරගන්න නොහැකිව පොලියත් මුදලුත් දෙකම නැති තත්වයට පත්වෙලා තිබුණා. එයට අපිට තොරතුරු දෙන්න පුළුවන්කමක් නෑ. මහජන නියෝජිතයන් ලෙස වීරවංශ මන්ත්‍රීතුමා මේකට අදහස් ප්‍රකාශ කලා. ප්‍රචාරක මාධ්‍යයෙන් හෝ නැත්තම් ගම් තුල යම් දැන්වීමක් අලවලා හෝ ගැටළු තිබෙන පුද්ගලයන් සම්බන්ධ කරගන්න පුළුවන් නම් අපිට මෙය ගැටළුවක් නැතිව අර්ථවත් විදියට සහයෝගයක් දක්වන්න පුළුවන්. විශේෂයෙන්ම ඩේලි කෑෂ් පිළිබඳව තමයි ගැටළුව තිබෙන්නේ. ස්වයං රැකියාවක් විදියට ගොඩක් අය ඒක කරනවා. ඒ තුලත් අසරණ භාවයට පත් වූ පවුල් හඳුනාගන්න ක්‍රමවේදයක් අනුගමනය කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,මෙය පළාත් පාලන කොමසාරිස්තුමා ගත් හොඳ තීරණයක්. විශේෂයෙන්ම පොලියට දීම පමණක් නොවෙයි. රාජ්‍ය ආයතනවල බැංකුවලින් බොහෝ දෙනෙක් ණය ගන්නවා. මිනිස්සුන්ට ඒ අයදුම්පතක් පුරවන්න හරිම ගැටළු සහගතයි. ඒ දැනුවත් කිරීම් තුල මිනිස්සු නොමඟ යන දේවල් තමයි ගොඩක් තිබෙන්නේ. ණය ලබා දීම් වලටම වෙන් වූ නිලධාරීන් ඉන්නවා. ඒ වගේම තැරැවුකාරයෝ ඉන්නවා. ගම්වල ඉන්න බොහෝ දෙනෙක් සාමාන්‍ය දැනුමක් තිබෙන මිනිස්සු. මේ අය ණයක් ගන්න ගියාම ගොඩක් වෙලාවට අසරණ වෙනවා. අද ප්‍රාදේශීය සභාව විතරක් නොවෙයි, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා මේ වගේ යෝජනා වලින් ජනතාව දැනුවත් කරලා මේ ජනතාවගේ දුෂ්කරතාව නිදහස් කල හැකිආකාරයේ ණය සහන ක්‍රමයක් දෙන්න පුළුවන්. එමෙන්ම අයදුම්පත්‍ර ලේඛනමීට වඩා සරල විය යුතුයි. ලංකාව කියන්නේ සිංහල බෞද්ධ රටක්. මේ රටේ සිංහල දැනුම තියන මිනිස්සු තමයි රාශියක් ඉන්නේ. එතකොට ඒ මිනිස්සුන්ට සිංහල භාෂාවෙන් සරල විදියට ණය අයදුම්පත්‍රය ලබාදෙන්න

පුළුවන් නම් හොඳයි. පළාත් පාලන කොමසාරිස්තුමා මේ පිළිබඳව අපව දැනුවත් කිරීම හොඳ දෙයක්. මම හිතනවා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් තමයි ගම ගැන දන්නේ. මෙය ඉතාම වැදගත් යෝජනාවක්. ගම්වල දැනුවත් කිරීමක් කරලා, මේ පිළිබඳ පත්‍රිකාවක් හදලා ඒ තොරතුරු ලබා ගන්නවා නම් හොඳයි කියලා මම අදහස් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, උප සභාපතිතුමා සඳහන් කල ආකාරයට සභාව මැදිහත්වෙලා මේකට ක්‍රියාමාර්ගයක් ගන්නවා නම් හොඳයි කියලයි මගේ අදහස.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මන්ත්‍රීවරුන් හරහා තම තමන්ගේ බල ප්‍රදේශවල තොරතුරු එකතු කරගෙන, අපි එකතුවෙලා මේ පිළිබඳ සාකච්ඡා කරලා, මේ ගැන ජනතාව දැනුවත් කල හැකි ආකාරය පිළිබඳව වැඩපිළිවෙලක් සකස් කරගනිමු. ඒ සමඟ පළාත් පාලන කොමසාරිස්තුමා සැලසුම් කරන දේ අපිට දැනුම් දුන්නම ජනතා වඩාත් දැනුවත් කරන්න අවස්ථාව අපි සලසා ගමු.

ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ලාගේද අදහස් සැලකිල්ලට ගෙන මේ පිළිබඳව තොරතුරු රැස්කර ඉදිරියේදී මෙම තොරතුරු පලාත් පාලන දෙපාර්තමේන්තුවට යොමු කිරීමට තීරණය විය.

**03.4<u>ආඬියාදෙණිය විද්‍යාලය පිහිටි ඉඩම පිළිබඳව උද්ගත වී ඇති ප්‍රශ්නය සම්බන්ධව.</u>**

අංක 06 වැත්තෑව කොට්ඨාශයේ අංක 980, මැදගම්පොල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ආඬියාදෙණිය විද්‍යාලය පිහිටි ඉඩම සම්බන්ධයෙන් උද්ගත වී ඇති ප්‍රශ්නය පිළිබඳව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ජී.සෙනරත් මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙය 2013 වසරේ සිට පැන නැගුන ප්‍රශ්නයක්. මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්තුමියට දැනුම් දීලා තිබෙනවා. “මේක හරිම කරදරයක්, ඔබතුමිය මේකෙන් අයින්වෙලා යන්න”කියන එක තමයි විදුහල්පතිතුමියට අවසානයේ මේ සඳහා ලබා දීලා තිබෙන තීරණය. එතුමියට ගැටළුවක් නෑ, එතුමියට අවශ්‍ය නම් යන්න පුළුවන්. නමුත් මෙම පාසල වැසිලා තිබුනේ. එතුමිය තමයි මේ පාසල දියුණු කලේ. මේකේ දේශපාලන හස්තයක් ක්‍රියාත්මක වෙනවා. මොකද්ද කියන්න දන්නේ නෑ. මෙය විසඳිය යුත්තේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්. නමුත් දැන් මේක සභාවට ඇවිල්ලා. විශේෂයෙන්ම රජයේ ඉඩමකින් පෞද්ගලික නිවසකට යන්න පාරක් දෙන්නේ නෑ. නමුත් මේ පාසල මැදින් මේ පාරේ බීමත් මිනිසුන් නිතරම යනවා. මේ මිනිස්සු විදුහල්පතිතුමියට තර්ජනය කරනවා. මේකට එහා පැත්තේ තව ඉඩමක් තිබෙනවා. විදුහල්පතිතුමිය මේ පාසල් භූමියේ වැසිකිලියක් ඉදි කලා. එය හදලා අවසන් වෙන විට උඩ ඉඩම හිමි අය එහෙම වැසිකිළි හදන්න බෑ ඔවුන්ටත් එහි අයිතිය තිබෙනවා කියලා වැට ගැහුවා. දැන් වැසිකිළියත් තිබෙන්නේ ඒ වත්තේ. දැන් මේක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දීලා තිබෙනවා මැනුම් කටයුතු කරන්න. ඒක කතා කරන්න ගියාම එතුමිය කියනවා ඔබතුමිය කරදරයක්, මාරුවෙලා යන්න කියලා. මේක අපි මේ සභාවෙන් හරි විසඳනවා නම් හොඳයි කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, විශේෂයෙන්ම අපේ බල ප්‍රදේශයේ පාසලක් සම්බන්ධවයි මේ ගැටළුව තිබෙන්නේ. කලාප අධ්‍යාපන කාර්යාලයෙන් විදුහල්පතිවරයෙක් පත්කරලා පාසලට එව්වම පාසල් පරිපාලනයේ ප්‍රධානියා තමයි විදුහල්පතිනිය. පාසල සම්බන්ධව ගැටළුවක් තිබෙනවා නම් එතුමියට අයිතියක් තිබෙනවා ඒ සම්බන්ධව තීරණයක් ගන්න. මේ පාසලේ විදුහල්පතිතුමියට

උනන්දුවක් තිබෙනවා මේ පාසල ගොඩ නැංවීමට. මේ පාසලේ ගේට්ටුව වහලා විදුහල්පතිතුමියට යන්න කියනවා නම් ඒ වැස්සකටවත් ඉස්කෝලේ ගිය නැති කෙනෙක්. විශේෂයෙන් මේ පාසල් මාර්ගය අවහිර කරන පුද්ගලයෙක් ඉන්නවා නම් ඔහු හෝ ඇය බුද්ධිමත්ව සිතිය යුතුයි මගේ දරුවොත් පාසල් යනවා, නිදහස් අධ්‍යාපනයෙන් පෝෂණය ලබනවා, ඒ නිසා අපි මෙහෙම කරන්න හොඳ නෑ කියලා. මේ නිවසට යන්න වෙන කොහෙන් හරි පාරක් තියෙන්න ඇති. විශේෂයෙන්ම මේ යෝජනාව හොඳයි. මේකෙදි අපට කරන්න පුළුවන් මග පෙන්වීම පමණයි. මේක ප්‍රාදේශීය සභා මාර්ගයක් නොවෙයි. රජයේ පාසලක් සම්බන්ධ ගැටළුවක්. විශේෂයෙන්ම මේකේ ප්‍රධානියා වෙන්නේ එක පැත්තකින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා. නමුත් මේ රජයේ ඉඩම් සම්බන්ධව අයිතිකරු වෙන්නේ ප්‍රාදේශීය ලේකම්තුමිය. එතුමියගේ වගකීම වෙන්නේ මේක නිරවුල් කරන එක. මේකට අපේ කවුරුත් විරුද්ධ නෑ. ඒ නිසා මෙය අතිගරු ජනාධිපතිතුමන්ට, ගරු විෂය භාර අමාත්‍යතුමන්ට, වයඹ පළාත් සභාවේ අධ්‍යාපන ලේකම්තුමාට මෙන්ම ගරු ආණ්ඩුකාරතුමන්ට මේ ගරු සභාවේ ඉල්ලීම් ලිපිය යවලා මේකට නිවැරදි විසඳුමක් ගන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ විදුහල්පතිතුමිය ඇවිල්ලා තමයි පාසලේ වැටවල් ගහලා, සුද්ධ පවිත්‍ර කරලා මෙය පාසලක් විදියට ගොඩනැංවූයේ. දැන් මේ පාසල යම් මට්ටමකට දියුණුවෙලා තිබෙනවා. මේ පාසල ගොඩනංවනවා කියන්නේ මැදගම්පොල, අලව්ව පාසල්වල 1 ශ්‍රේණියට ළමුන් ඇතුලත් කර ගැනීමට තිබෙන තදබදය අඩු වෙනවා. මම දන්න විදියට මේ ප්‍රශ්නය ඇතිවුනේ පාසලට යාමට ගේට්ටුව දැමීමත් සමගයි. ඔය ඉඩමට යන්න වෙන මාර්ගයක් ඇති. මේ වෙලාවේ අපිට කරන්න පුළුවන් මැදිහත්වීම තමයි මේ පාසල රැක ගැනීමට කටයුතු කරන එක. මේ විදුහල්පතිතුමියගෙනුත් විශාල සේවයක් ගන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි ප්‍රාදේශීය සභාවක් හැටියට මේ සඳහා ඒකමතිකව උදව් කල යුතුයි. දැන් මේ පාසල ගොඩක් හොඳින් දියුණු වෙන පාසලක්. ප්‍රාදේශීය ලේකම්තුමියගේ ස්ථාවරය කුමක් වුවත් ආණ්ඩුකාරතුමා සහ අධ්‍යාපන අමාත්‍යාංශය දැනුවත් කර මේ සඳහා යම් කිසි සාධාරණයක් ඉටුකර මෙම පාසල ගොඩ නැංවීමට විදුහල්පතිතුමියට ශක්තියක් විය යුතුයි කියලයි මම හිතන්නේ.  ඒ වගේම අල්ලපු නිවසේ පුද්ගලයාට කොහෙන් හෝ පාරක් ඇති. එය ලබා දීමට අපි මැදිහත් වෙනවා නම් හොඳයි. සියළු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ඇතිව මේ පාසල රැකගැනීමට එකාවන්ව කටයුතු කරමු යැයි මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, හිරගෙවල් වැසිය යුතු කාලයක හිරගෙවල් ඇරලා පාසල වහන්න තමයි හදන්නේ. අපිට හොඳම උදාහරණය තමයි ඊයේ විවාදයේදි වැලිගම ප්‍රාදේශීය සභාව පැවසුවා ආයතන ප්‍රධානියෙතුට අධ්‍යාපන සුදුසුකම් අවශ්‍ය නෑ කියලා. අනාගතය භාරගන්න ඉන්න මල් කැකුළු වලට අධ්‍යාපනය ලබා දෙන පාසලට යන මාර්ගය වසා තැබීමට අනුබල දෙන්න තරම් රාජ්‍ය නිලධාරීන්ට කුහකත්වයක් තිබෙනවා නම්, මේ ගැටළුව විසඳීම සඳහා පක්ෂ භේදයකින් තොරව මේ කටයුත්ත සිදු කරන්න අපි හැමෝගෙම වගකීමක් තිබෙනවා. හැකි ඉක්මනින් මේ පාසලට යන මාර්ගය නීත්‍යානුකූලව ඔවුනට ලබාදීලා, ඉඩම් හිමි පුද්ගලයාටත් ඔහුගේ නිවසට ගමන් කිරිමට හැකි මාර්ගයක් සකස් කර ගැනිමට අවශ්‍ය සහයෝගය සලසා දීමට අවශ්‍ය කටයුතු සිදු කර මේ පාසලේ මාර්ගයේ ගැටළුව නිරාකරණය කර ගැනිමට අවශ්‍ය සහයෝගය ලබාදෙමු කියල මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි මේ ගැටලුව බලන්න ගියා. ඒ අවස්ථාවේ ප්‍රාදේශීය ලේකම්තුමිය කීවේ මේ ගැටලුව විසඳන්න නම් ඔවුන්ට මේ පාර ලබාදිය යුතුයි කියල. අපි කිව්වා පාර දෙන්න ඕන නෑ කියලා. අපි මන්ත්‍රීතුමන්ලා එකතු වෙලා පෙළපාලියක් හරි කරනවා නම් ඇරෙන්න ප්‍රාදේශීය ලේකම්තුමිය මේක විසඳන්නෙ නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ලඟම පාසල හොඳම පාසල බවට පරිවර්තනය වන අවස්ථාවක ඒක අගයන අපි ලඟම පාසල වැහෙන පාසල බවට පත්වෙලා. ආයතනයක් විදිහට අපිට මේ සඳහා අවතීර්ණ වෙන්න පුළුවන් ක්‍රමවේදය කුමක්ද යන්න සොයා බැලිය යුතුයි. විශේෂයෙන්ම මේ සඳහා පොලිසියත් මැදිහත් වෙලා තිබෙනවා. බෝයවලාන පාසලෙත් ඔය ගැටළුව තිබුණා. එහා පැත්තෙ තිබෙන්නේ හේන් යාය. පාසල හරහා තමයි හේන් යායට ගමන් කලේ. විවිධ අවස්ථාවල පාසලට සිදුවන අකටයුතුකම් ගැන කියල ක්‍රියා මාර්ග ගත්තත් මේ සඳහා නිශ්චිත විසඳුමක් ලැබුණෙ නෑ. නමුත් පාසල් සංවර්ධන සමිතියත් ගුරු දෙගුරු මණ්ඩලයටත් මැදිහත් වෙලා යෝජනාවක් සම්මත කර එය අදාල ස්ථාන වෙත යොමු කලා. ඉන් පසුව ගුරු දෙගුරු සමිතිය විසින් පාර වැහුවා. දැන් ඒ පාර වහල තිබෙන්නේ. ඒකත් එක ක්‍රමවේදයක්. විශේෂයෙන්ම ගමේ ජනතාව මැදිහත් වෙනවා නම් සභාවක් විදිහට අපිටත් යම් මැදිහත් විමක් වෙන්න පුළුවන්. ඒ නිසා මේ ගැටළුවට අදාල බලධාරීන්ට යොමු කරනවා නම් හොඳයි කියන එකයි මගේ වැටහීම.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය**

ගරු සභාපතිතුමියනි, මෙය ඉතාම කණගාටුදායක සිද්ධියක්. මම වැවල විද්‍යාලයේ සේවය කරන කාලයේ ජයතිලක මන්ත්‍රීතුමා කීවා වගේ පාසලේ මේ පුද්ගලයා භාවිතා කරන මාර්ගය අපි වැහුවා. එවිට මේ පාර නිකම්ම වැහිල ගියා. අපි සියළු දෙනා එකතු වෙලා මේකට මැදිහත් වෙලා දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරගන්න අපි ප්‍රාදේශීය සභාව විදිහට මැදිහත් වෙමු යැයි මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, මන්ත්‍රීතුමියගේ යෝජනාව ක්‍රියාත්මක කරන්න හැකියාවක් නැතිවේවි. මොකද මේ පාසලට එන්නෙ ගමේ ළමයි නොවෙයි. අවට ගම් වල සිටින අයයි. ගමේ දෙමව්පියන්ගේ දරුවො එනවා නම් තමයි ගමේ දෙමව්පියෝ එකතුවෙලා එය ක්‍රියාත්මක කිරීමට හැකිවෙන්නෙ. ගරු සභාපතිතුමියනි, අපි සියළු දෙනාගෙ යෝජනාවක් විදිහට ප්‍රාදේශීය ලේකම්තුමිය මෙතනට ගෙන්වාගෙන එතුමියගෙන් මේ ගැන විමසනවා නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, නුංගමුව පාසලෙත් ඔය වගේ ගැටළුවක් තිබුණා. එවකට හිටපු විදුහල්පතිතුමා හා ප්‍රාදේශීය ලේකම්තුමා මැදිහත් වෙලා මේ ගැටලුව විසඳුවා. අපි දකින විදිහට ප්‍රාදේශීය ලේකම්තුමියට තමා මේ ගැටළුවට විසඳුමක් දෙන්න පුළුවන්. එතුමිය මේකෙන් මගාරින්න ඒ වගේ යෝජනාවක් කරනවා නම් ඇත්තටම අපේ හිටපු ජනාධිපතිතුමාට සිදුවුන දෙයමයි එතුමියටත් වෙන්නෙ. මේ ගැටලුවේදී සියලු මන්ත්‍රීවරු එකතු වෙලා, ප්‍රාදේශීය ලේකම්තුමිය ප්‍රශ්නවලට පිළිතුරු දෙන ආකාරය පිළිබඳව ජනාධිපතිතුමාට හෝ ලිපියක් යොමු කරලා මේ සඳහා විසඳුමක් දෙන්න කියන ඉල්ලීම කරන්න කියල මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පාසලේ විදුහල්පතිතුමිය ඉවත්වීම නොවෙයි, ප්‍රාදේශීය ලේකම්තුමිය බල ප්‍රදේශයෙන්ම අයින් වෙලා ගියා නම් ලොකු ප්‍රශ්න ටිකක් විසඳගන්න පුළුවන්. මගේ කොට්ඨාශයේ හඟවත්ත සහ ලෙව්දෙණිය ප්‍රදේශවල පාසල් දෙකක් වැහිල තිබෙනවා. අවුරුදු ගණනක ඉඳල ගාමිණී මන්ත්‍රීතුමාට මම යෝජනා කරනවා එක දිනයක පාසලේ ගුරුවරුයි,

දෙමව්පියොයි ඔක්කොම එකතු කරගෙන පොලිසියට පැමිණිල්ලක් ගොනු කරන්න කියලා. අපි එතනට ගිහිල්ල වැට ගහල පාර වසා දමමු. ප්‍රාදේශීය ලේකම් මේකට වගකියන්නේ නැත්තම් අපි මේකට වග කියමු. එසේ කරල මේ පාසල ආරක්ෂා කරගමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ පාසලේ විදුහල්පතිතුමියගේ හා ගුරු මණ්ඩලයේ දක්ෂතාවය මත මේ පාසල තවදුරටත් ආරක්ෂා වෙලා තියෙනවා. අපි හැමදාමත් ප්‍රාදේශීය ලේකම්තුමියගේ ක්‍රියාකලාපය පිළිබඳ සාකච්ඡා කරනවා. නමුත් නිසි ක්‍රමවේදයකට එන්නේ නෑ. මේක මුළු ප්‍රදේශයටම බලපාන සිදුවීමක්. අපි මේ ප්‍රාදේශීය ලේකම්තුමිය සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව වචනයකට සීමා නොකර සියළු දෙනා සාකච්ඡා කරල තීරණයක් ගමු යැයි මම යෝජනා කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

ආඬියාදෙණිය විදුහල ගැන මේ මන්ත්‍රීතුමන්ලා ඔක්කොම ඉන්නෙ එකම මතයක බව අපි දීර්ඝ කාලයක සිට දන්නවා. මම සභාවට ආවට පස්සේ වාර දෙකක් උත්සව සඳහා මේ පාසලට ගිහිල්ල තිබෙනවා. මේ පාර සම්බන්ධ ගැටළුව පැහැදිලිව පෙන්වීමට විදුහල්පතිතුමිය අපිව තව වතාවක් කැඳෙවුවා. පාසලට යන හැමෝටම පැහැදිලි වෙනවා ප්‍රධාන ගේට්ටුව පාසලට තමයි තිබෙන්නේ. ඒ ගේට්ටුවෙන් ඇතුල්වෙලයි මේ පුද්ගලයන් තම නිවසට යන්නේ. නමුත් පාසල හරහා මේ පුද්ගලයින්ට ගමන් කිරිමට ඉඩ දීම ගැටලුවක්. මේ පුද්ගලයාගේ තිබෙන හැසිරීම් රටාව අනුව විවිධ අවස්ථාවල දෙමව්පියන් ඇවිල්ල දරුවන්ගෙ ආරක්ෂාව වෙනුවෙන් තැන් තැන්වල හිටගෙන ඉන්නවා. ඒ වගේම මේ පාසලේ අතීතය ගැනත් ඔබතුමන්ලා කතා කලා. ප්‍රධාන පාර අයිනේ තිබෙන මේ පාසල වැහෙන්න ගියත් නැවත මේ පාසල දියුණු වෙලා තිබෙනවා. මුලදීමේ පාසලට ගියේ මා ඔය අයිනෙ සිටින දරුවන්. නමුත් පාසල පවත්වාගෙන යන ගුරුවරු සහ විදුහල්පතිතුමිය අධෛර්ය නොවී දැන් මේ පාසල ඉතා දියුණු තත්වයට ගෙනවිත් තිබෙනවා. අපි සියළු දෙනාම ඒ සඳහා අපේ ගෞරවය පුද කල යුතුයි. පසුගිය වසරේ අපේ ගම් වල දරුවන්ටත් ගැටළුවක් ආවා. ප්‍රාථමික අංශයට සිසුන් ඇතුලත් කර ගැනිමේදී සිතියමක් ඇදල ඒ කවය ඇතුලෙ සිටින ළමයි පමණයි ඒ පාසලට ඇතුලත් කර ගත්තෙ. ඒ නිසා කැබැල්ලවිට, ගල්පොත්තේපොල ප්‍රදේශවල ළමයින්ට පවා යන්න සිදුවුනේ මේ ආඬියාදෙණිය විදුහලට. අද ඒ පාසලට වටිනාකමක් ඇතිවෙලා තිබෙනවා. පාසලකට ඉඩමක් ඉබේ පහල වෙන්නේ නෑ. කව්රුන් හෝ පරිත්‍යාග කලයුතුයි. නැත්නම් රජයේ ඉඩමක් විය යුතුයි. මේකෙ බිම් ප්‍රමාණය, මායිම් පිළිබඳව විස්තර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශයේ තිබිය යුතුයි. එතනින් ඒ කටයුතු සිදුවෙන්නේ නැතිනම් දිස්ත්‍රික් ඉඩම් අංශයට මගින් මේ ඉඩමේ මායිම් හරියට පැහැදිලි කරගත යුතුයි. ඒ වගේම අධ්‍යාපන දෙපාර්තමේන්තුවටත් ඒ සඳහා අයිතියක් තිබෙනවා. තමන් සතු මේ පාසල්වල ආරක්ෂාව සහ භූමිය සුරැකීම පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂකවරයාට, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරයාට තිබෙන ලොකු වගකීමක්. එමෙන්ම මායිම් ආරක්ෂා කිරිම එතුමන්ලාගෙ කටයුත්තක්. මේ සම්බන්ධව මෙහි පාරක් තිබුණාද යන්න පරික්ෂා කිරිම සභාවට භාර දුන්නම තාක්ෂණ නිලධාරීන් පරික්ෂා කරල මේ ඉඩමේ ගැටළුව හඳුනාගන්න විට ඉඩමේ අනිත් පැත්තෙනුත් අඩිපාරක් තිබෙන බවත් එමගින් ඉඩම් හිමියෙක්ට අයිති ප්‍රමාණයක් පාසලට ඇතුලත් වෙලා එහි පාසල් වැසිකිලිය සාදා තිබෙන්නේ ඒ ඉඩමේ කොටසකුත් සමඟ බවත් කර්මාන්ත කමිටුවේදී කියවුණා. ඉඩම් හිමියා කැමති වෙලා තිබෙනවා පාසලට ඇතුල්වෙලා තිබෙන ප්‍රමාණය අත් ඇරලා පෙර පැවති පාර පාවිච්චි වෙන විදිහට සකස් කර ගන්න. පොඩි ප්‍රමාණයක් තමා පාසලට ඇතුලත් වෙලා තිබෙන්නෙ. එම නිසා කමිටුවෙදි තීරණය වුනා අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා, ප්‍රාදේශීය ලේකම්තුමිය සහ ඉඩම් හිමියන් සමඟ සාකච්ඡා කරන්න. අපේ මාර්ග සිතියම් වලටත් ඒ මාර්ගය ඇතුලත් වෙලා නැහැ. අපි පාසල වම් පැත්තෙ ඉඩම් හිමියන් සමඟ සාකච්ඡා කරල ඒ මාර්ග සිතියම් ගත කල විට ඒ මාර්ගය ගැසට් වෙනවා. එතකොට ප්‍රශ්නයක් වෙන්නෙත් නෑ. නමුත් අර දකුණු පැත්තෙන් සිටින සිටින පුද්ගලයගේ තමයි මේ ගැටළුව තිබෙන්නේ. අපි ඉක්මනින් මේ ප්‍රශ්ණයට විසඳුමක් ලබා දිය යුතුයි. අපි මේ

පිළිබඳව අධ්‍යාපන අධ්‍යක්ෂතුමාටත් අපේ සභාවේ තීන්දුව සඳහන් කරමින් ලිපියක් යොමු කර හෝ හමු වී සාකච්ඡා කරලා, පළාත් පාලන කොමසාරිස්තුමා සමඟත් සාකච්ඡා කරලා අපිට කල හැකි සෑම පැත්තකින්ම මේ සඳහා බලපෑමක් කර පාසල ආරක්ෂා කර ගනිමු.

ඒ අනුව මේ සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් සම්බන්ධ කර මෙම ගැටළුව විසඳීමට සභාවක් ලෙස දිය හැකි උපරිම සහයෝගය ලබාදීම සුදුසු බවට තීරණය විය.

**03.5**<u>**මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ලබා ගැනීම සඳහා.**</u>

ඉහළ කලල්පිටිය සුසාන භූමිය අසල සිට හේන්යාය හරහා ඇති කන්ද පාර වැස්සට සේදී යාම නිසා ගමනාගමනයට අපහසු බවත් කලල්පිටිය විහාරස්ථානයේ කඨින චීවරය වැඩමවීම ද මෙම මාර්ගය ඔස්සේ සිදු කරන බැවින් අබලන්ව ඇති මෙම මාර්ගය පිළිසකර කිරීම සඳහා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ලබා දෙන ලෙසත් ඉල්ලීමක් කරමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. නිහාල් ඒකනායක මැතිතුමා මගින් ඉහළ කලල්පිටිය, මහරච්චිමුල්ල ලිපිනයේ ඩබ්. කපිල රුවන් කුමාර මයා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, කලල්පිටිය මාර්ගය අවුරුදු ගණනාවක් සිට ගමන් කිරිමට නොහැකි වන සේ අබලන් තත්වයේ පවතිනවා. ඒ වගේම කඨින චීවරය වැඩමවීම සිදු කරන්නේත් මෙම මාර්ගය ඔස්සේයි. ඒ නිසා හැකි ඉක්මනින් මෙම මාර්ගය පිළිසකර කර දීම සුදුසුයි.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

කාර්මික නිලධාරි වාර්තාවක් ලබාගෙන මේ අවස්ථාවේ සභාව මගින් වියදම් කිරිමේ අපහසුතාවය සලකා බලා දැරිය හැකි වියදම් ප්‍රමාණයට එය ඉටු කිරීමට කටයුතු කරන්නම්.

ඒ අනුව ඉහත කාර්ය සඳහා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ලබාදීම සුදුසු බවට තීරණය විය.

**03.6** <u>**නිවාස ආධාරයක් ලබා ගැනීම සඳහා.**</u>

නිවසේ ඉතිරි වැඩ නිම කරගැනීම සඳහා ද්‍රව්‍යමය හෝ මූල්‍යමය ආධාරයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරමින් 51/1, ඉඹුල්ගොඩ, අලව්ව ලිපිනයේ පදිංචි එච්.ඒ. උපුල් කුමාර ගුණවර්ධන මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම පුද්ගලයා ඉන්නෙ මගේ කොට්ඨාශයේ. ඔහුගේ නහරවල් කිහිපයක්ම අවහිර වුණා, ලේ කැටි හිරවෙලා. හරිම අපහසුවෙන් තමයි ඔහු ජීවත් වෙන්නෙ. ඒ නිසා හැකි සහනාධාරයක් ඔහුට ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඔහු මේ රෝගය නිසා හරිම අපහසුතාවයකට පත්වෙලා ඉන්නෙ. නමුත් ඔහු නිවස ඉදි කරලයි තිබෙන්නෙ. වහලය සකස් කර ගැනිමටයි ඔහුට අවශ්‍ය වෙලා තිබෙන්නේ. ඉඹුල්ගොඩ ගමේ ඉන්න ඉතා දිළිඳු පවුලක් නිසා අප සභාවෙන් යම් කිසි ආධාරයක් ලබා දෙන්න හැකි නම් ගොඩක් වටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම පවුල ඉතා දිළිඳු පවුලක්.නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවට යොමු කර අපේ සභාවේ තිබෙන උළු වලින් යම් ප්‍රමාණයක් ලබාදෙන්න හැකි නම් එය ගොඩක් වටින දෙයක් වෙයි. මේ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

ඔබතුමන්ලා යෝජනාවක් ඉදිරිපත් කර ස්ථිර කරනවා නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඉඹුල්ගොඩ ප්‍රදේශයේ පදිංචි උපුල් කුමාර මහතාගේ ඉල්ලීම අනුව ඔහුගේ නිවස සෙවිලි කර ගැනිම සඳහා වෙන්දේසි කිරිමට යෝජනා කර ඇති උළු වලින් උළු 1000 ක ප්‍රමාණයක් ලබාදිම සුදුසු යැයි මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව වෙන්දේසි කිරිමට යෝජනා කර ඇති උළු වලින් උළු 1000 ක ප්‍රමාණයක් 51/1, ඉඹුල්ගොඩ, අලව්ව ලිපිනයේ පදිංචි එච්.ඒ. උපුල් කුමාර ගුණවර්ධන මහතා වෙත ලබාදිම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**03.7**<u>**මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ලබා ගැනීම සඳහා.**</u>

ගල්දෙණිය ග්‍රාම නිලධාරී වසමේ පණාදණ්ඩ අතරගල්ල මාර්ගයේ දැඩි ලෙස බාදනයට ලක් වී ඇති ස්ථාන පිළිසකර කිරීම සඳහා මෙම මස 16 දිනට ප්‍රථම මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ලබා දෙන ලෙස ඉල්ලීමක් කරමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ආර්.එම්. ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මුදල් ප්‍රතිපාදන තිබෙන විදියට එය ලබා දීමට කටයුතු කරන්නම්.

ඒ අනුව ඉහත මාර්ගය සඳහා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ලබාදීම සුදුසු බවට තීරණය විය.

**03.8** <u>**2021 වර්ෂයේ ටෙන්ඩර් ලබා ගත් මාලු වෙළඳුන් සඳහා ක්‍රමානුකූල ස්ථානයක් සකස් කර ගැනීම සඳහා.**</u>

2021 වර්ෂය තුල ලබාගත් මාළු ටෙන්ඩර් සඳහා ස්ථානයක් පැවතුනත් හෝ මාළු වෙළෙඳුන්ට අයත් ස්ථානයක් පැවතුනත් අක්‍රමවත් ලෙස අලව්ව දුම්රිය මාර්ගය අසල මාළු වෙළඳාම සම්බන්ධයෙන් දැඩි විවේචන එල්ල වී ඇති බවත් එම තත්වය නිසා අලව්ව නගර සීමාව තුල මාළු වෙළඳ ව්‍යාපාරිකයාගේ ස්ථානයක හෝ සභාව මගින් ලබා දී ඇති ස්ථානයක මාළු අලෙවිසැල පවත්වාගෙන යන ලෙස දැනුවත් කිරීම සුදුසු බවත් දන්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පසුගිය දින අලව්ව බෝධිරාජ බෞද්ධ මධ්‍යස්ථානයේ උත්සවය පැවති අවස්ථාවේදී උත්සවයට බාධා වන ආකාරයට එම ස්ථානයේ මාළු වෙළඳාම කරගෙන ගියා. මෙම ලිපිය ඉදිරිපත් කිරීමට ප්‍රධාන හේතුව එයයි. ස්වාමීන් වහන්සේලා කීප දෙනෙක්ම ඒ පිළිබඳව විවේචනය කලා. මෙම ව්‍යාපාරිකයා ටෙන්ඩරය ලබා ගත් ස්ථානයේම මෙම ව්‍යාපාරය කරගෙන යන ලෙස ඔහුට උපදෙස් ලබා දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පසුගිය දින පැවති ආගමික උත්සවය අවස්ථාවේදී මෙම පුද්ගලයා මාළු වෙළඳාම සිදුකරගෙන ගියා. එක් පැත්තකින් ස්වාමීන් වහන්සේලා සහ බැතිමතුන් පෙරහැරේ යනවා. මේ ව්‍යාපාරිකයාට සාමාන්‍ය දැනීමවත් තිබුනේ නෑ. විශේෂයෙන්ම ඔහුව ගෙනවිත් ඔහුට අවවාද කරන්න. ලබන අවුරුද්දේ මාළු ලැලි ලබා දෙන විට යෝජනා කරන්න වෙළඳ සංකීර්ණයටම එන්න කියලා. ඒ වගේම එක් මාළු ලැල්ලකට වඩා එක් අයෙකුට ලබා ගැනීමට නොහැකි බවට කොන්දේසියක් ටෙන්ඩර් අයදුම්පත්‍රවලට ඇතුලත් කරන්න.

එමෙන්ම වලකුඹුර සංගිලි පාලම අසල මාළු ලැල්ල කාලයක් තිස්සේම ගැටළුවක් වෙලා තිබුණා. නමුත් මාළු මුදලාලි මේ ලඟදී අපේ සභාවේ නිලධාරියෙකුට චෝදනා කරලා තිබෙනවා. මෙම පුද්ගලයා මාළු වෙළඳාමත් සමඟම එළවළු වෙළඳාමටත් යොමු වෙලා තිබෙනවා. ඒ සඳහා ඔහුට බලපත්‍රයක් ලබා ගන්නා ලෙස උපදෙස් දුන්නාට පසුවයි මේ පුද්ගලයා එම නිලධාරියාට දෝෂාරෝපණය කර තිබෙන්නේ. මේ නිලධාරීන් අදාල කටයුතුවලට යොමු කරවන්නේ සභාවේ සභාපතිතුමිය, එසේ නොමැති නම් ලේකම්තුමිය. මේ පුද්ගලයාට වෙළඳ බලපත්‍රය ලබා දීමට

පෙර මෙම පුද්ගලයා ගෙන්වලා ඔහුට අවවාද කලායින් පසුව වෙළඳ බලපත්‍රය ලබා දීමට කටයුතු කරන ලෙස මම ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

වළකුඹුර සංගිලි පාලම ලග මාළු ලැල්ල කරන පුද්ගලයායි, එළවළු වෙළඳාම කරන පුද්ගලයායි අතර ගැටුමක් ඇති වෙලා පසුව ආදායම් පරීක්ෂක මහතා මේ කඩ දෙකම පරික්ෂා කරලා තිබෙනවා. පසුගිය කාලේ සෑම තැනම පාහේ එළවළු කඩ ආරම්භ කරලා තිබුණා. මේ පුද්ගලයා සභාවට ආපු අවස්ථාවේ අපේ නිලධාරීන්ට චෝදනා කිරීම පිළිබඳව මම ඔහුට දොස් කියලයි ආපසු යැව්වේ. අපි ඒ අවස්ථාවේ ඔහුට බලපත්‍රය ලබා දුන්නේ නෑ. ඔහු ආපසු ඉල්ලීමක් කරලා තිබුණා. එය අපි මුදල් කමිටුවට යොමු කල විට වළකුඹුර දුම්රිය ස්ථානය අසල ටෙන්ඩර් මාළු ලැල්ල කරගෙන යන ස්ථානයේම අදාල ටෙන්ඩර්කරු බලපත්‍ර රහිතව එළවළු වෙළඳාම සිදු කරන බැවින් බලපත්‍රයක් සහිතව එළවළු වෙළඳසැලක් පවත්වාගෙන යනු ලබන G.R.S. අබේසිංහ මහතාට අසාධාරණයක් වන බව දන්වා අපට ලිපියක් ඉදිරිපත් කලා. මේ පිළිබඳ සලකා බැලූ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව, සභාවට ආදායමක් ලැබෙන බැවින් එළවළු විකිණීම සඳහා වෙළඳ බලපත්‍රයක් ලබාගෙන වෙළඳාම සිදු කිරීම සුදුසු බවට තීරණයක් ගෙන තිබුනා. ආදායම් අංශයේ නිලධාරීන් වෙළඳ බලපත්‍රයක් ලබා දීමට අවශ්‍ය ලිපි සකස් කර තිබුණා. නිලධාරීන්ට මම දැනුවත් කලා අදාල නිලධාරියාට චෝදනා කල මෙම පුද්ගලයා ගෙන්වලා අදාල නිලධාරියාගෙන් සමාව ගත්තාට පසුව එම බලපත්‍රය ලබා දීමට කටයුතු කරන ලෙස. මේ සභාවේ කටයුතු කරන කිසිම නිලධාරියෙකුට හෝ සේවකයෙකුට රාජකාරියේදී එසේ අසාධාරණයක් වෙන්න මම ඉඩ ලබා දෙන්නේ නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සභාපතිතුමිය මේ පිළිබඳව නිවැරදිව තීන්දුව ලබා දීලා තිබෙනවා. මේ මාළු ලැල්ලේ පුද්ගලයා කියන්නේ අපි ගොඩාක්ම උදවු කල අයෙක්. අපි සභාවේ නිලධාරීන්ගේ ආත්ම ගෞරවය රැකෙන ආකාරයට තීන්දු තීරණ ගත යුතුයි. ඒ වගේම පාරෙන් එහා පැත්තේ එළවළු වෙළඳාම කරගෙන යන පුද්ගලයා මා ඔයෙන් එහා පැත්තේ පුද්ගලයෙක්. ඔවුන් දෙදෙනා අතර ගැටුමක් පවා ඇතිවෙන්න ගිහින් තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේක මගේ කොට්ඨාශයේ ඇතිවී තිබෙන ප්‍රශ්නයක්. මම ඒ ගැන දැනුවත් වෙලා සිටියේ නෑ. නිලධාරීන්ටත් යම් වගකීමක් තිබෙනවා කොට්ඨාශයේ යම් ක්‍රියාවක් වෙනවා නම් ඒ පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලාවත් දැනුවත් කරන්න. ඒ වගේම සභාවේ නිලධාරියෙක් සභාවේ බලය අරගෙන තමයි යම් කිසි ක්‍රියාවකට යන්නේ. ඒ නිලධාරියාට කාගෙන් හෝ යම් අපහසුතාවයක් වන ලෙස යමක් සිදු වුනා නම් එම පුද්ගලයාගෙන් කරුණු විමසලා සභාවේ ගරුත්වය ආරක්ෂා වන ලෙස කටයුතු කල යුතුයි.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මන්ත්‍රීතුමන්ලා කියන කටයුතු දැනට සිදු වෙලා තිබෙනවා. මේ පුද්ගලයා හරිම ආවේගශීලි පුද්ගලයෙක්. ඔහුව ගෙන්වලා අවවාද කලා. වෙළඳ බලපත්‍රයකින් ලැබෙන ආදායම් අඩුවෙන්න පුළුවන්. සභාවේ ආදායම් හොඳටම අඩුවෙලා තිබෙන නිසාත් එමෙන්ම අද රටේ තිබෙන ප්‍රශ්ණත් එක්ක කවුරුහරි සුළුවෙන් හෝ ව්‍යාපාරයක් ආරම්භ කරනවා නම් එයට අතහිත දෙන්න කියලා සභාවෙන් යෝජනාවක් ආවා. තීන්දු තීරණ සියල්ලම ගැන සලකා බලලයි අදාල නිලධාරියාගෙන් සමාව ගත්තට පසු ඔහුට වෙළඳ බලපත්‍රය ලබාදෙන්නේ කියන මේ තින්දුව ගත්තේ.

ඒ වගේම නලින් මන්ත්‍රිතුමාගේ යෝජනාවේ තිබුණ මාළු ලැල්ල පිළිබඳ ප්‍රශ්නෙදි මේ පුද්ගලයාට සාමාන්‍ය දැනිම පිලිබඳවත් අවබෝධයක් නැති බවයි පෙනෙන්නෙ. මේ මාළු වෙළෙන්දා එදා දවසෙ සිදුකල ක්‍රියාව අපි කවුරුවත් අනුමත කරන්නෙ නෑ. එම ස්ථානයේ ඒ වෙළඳාම කරනවා නම් නීති රීති වලට අවනතව කටයුතු කරන්න කියල අපි ඔහුට අවවාද කල යුතුයි. ඒ වගේම ලබන අවුරුද්දට අපි ටෙන්ඩර් දැන්වීම් දාල තිබෙන්නෙත් ටෙන්ඩර් ලබාගන්න

ස්ථානයෙම ඒ මාළු වෙළදාම සිදු කිරිම කල යුතුයි කියලා. අද වෙළඳ සංකිර්ණයේ වැඩි දෙනෙක් ඉන්නෙත් මා ඔයෙන් එහා පැත්තෙ පුද්ගලයන්. අපි මේවා ආරම්භ කරල තිබෙන්නෙත් බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය නගා සිටුවීමටයි. නමුත් ඉන් වැඩි ප්‍රතිලාභයක් අරන් තිබෙන්නේ මේ ප්‍රදේශයේ අය නොවෙයි. නගරයේ යම් උත්සව අවස්ථාවක් තිබෙන අවස්ථාවක මේ ප්‍රචාරක කටයුතු කරන්න එපා කියල අපි මේ මාළු ව්‍යාපාරිකයා දැනුවත් කරනවා.

ඒ විතරක් නොවෙයි ඊයේ අපේ විවාදය පැවැත්වෙන විට සංගීත සංදර්ශනයක් සඳහා සභාවට අයිති ක්‍රීඩා පිට්ටනිය වෙන්කර තිබුනා. අපි කිවුවා සවස 6 සිට7 දක්වා කාල සීමාව තුල මේ ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කරන්න එපා, නවත්වන්න කියල. ඒ වෙලාව සංගීතය පවත්වන වෙලාවක් නෙවෙයි. ඔවුන් එයට ඇහුම්කන් දුන්නෙ නෑ. මේ නිලධාරීන්ට විටින් විට ඔවුන්ව ඒ පිළිබඳ දැනුවත් කරන්න සිදු වුණා. ඒ පුද්ගලයින්ට එම ප්‍රචාරක කටයුතු පටන් ගන්න අපෙන් විමසීමක් කරන්න තරම්වත් සාමාන්‍ය දැනිමක් ඔවුන්ට තිබුනේ නෑ. එයයි අද රටේ තත්වය.

ඒ අනුව ලබන වසරේ සිට ටෙන්ඩර් ලබාගත් ස්ථානයේම මාළු වෙළදාම සිදුකල යුතු බවට දන්වා සිටීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**04. <u>යථා පරිදි කල් දීඇති ප්‍රශ්න - නැත</u>**

**05. <u>යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**(05-1)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/54 - 01 දරණ යෝජනාව</u>**

1995 වර්ෂය තක්සේරු ලේඛනය අනුව දම්පැලැස්ස පාර - වම, වරිපනම් අංක 128 හා 130 ලෙස හා ජනරජ මාවත වම, වරිපනම් අංක 131 ලෙස වරිපනම් අංක ලබා දී ඇත. නමුත් 2009 වර්ෂයේ සිට දම්පැලැස්ස පාර දකුණ අංක 128 හා 130 වෙනුවට අංක 128 පමණක් ලබා දී ඇති අතර ජනරජ මාවත වම අංක 131 ලබා දී නොමැත. එහෙත් 2022.08.05 දින සිදුකරන ලද ස්ථාන පරීක්ෂණයකදී නිරීක්ෂණය වූයේ 1995 වර්ෂය තක්සේරු ලේඛනයට අනුවම තවමත් එම දේපල පිහිටා ඇති බවයි. එහෙයින් 1995 වර්ෂයේ නිකුත් කල පරිදිම එම දේපලවලට අදාල වරිපණම් අංක 128, 130 හා ජනරජ මාවත වම අංක 131 ලෙස වරිපණම් අංක 03 ක් ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 1995 වර්ෂයේ නිකුත් කල පරිදිම ඉහත දේපලවලට අදාල වරිපණම් අංක 128, 130 හා ජනරජ මාවත වම අංක 131 ලෙස වරිපණම් අංක 03 ක් ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-2)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/54 - 02 දරණ යෝජනාව</u>**

අංක 123/6 දරණ දේපලෙහි කුඩා නිවස කඩා ඉවත්කර ඇති බවත් දැන් එහි ඇත්තේ ගරාජයක් පමණක් බවත් එබැවින් එම දේපල සඳහා වන බදු මුදල සංශෝධනය කර දෙන ලෙසත් ඉල්ලීමක් කරමින් කිරිවානාපොල මහරච්චිමුල්ල ලිපිනයේ පදිංචි ඒ.එච්.එස් විජේසිංහ මහතා විසින් ලිපියක් යොමු කර ඇති අතර 2022.07.28 දින කරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදී කුඩා නිවස ඉවත් කර ඇති බවට නිරීක්ෂණය වූ බව මහරච්චිමුල්ල උප කාර්යාලයේ ස්ථාන භාර නිලධාරී විසින් වාර්තා කර ඇත.ඉහත දේපල සඳහා වන බදු මුදල සංශෝධනය කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අංක 123/6 දරණ දේපල සඳහා වන බදු මුදල සංශෝධනය කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-3)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/54 - 03** දරණ යෝජනාව</u>

අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන වැටුප් සකස්කරනු ලබන EPSON LQ 2190 වර්ගයේ මුද්‍රණ යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා රු.8500.00 ක් වන අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.119 බෞද්ධාලෝක මාවත, පුවක්ගස් හන්දිය, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක පී.සී.වර්ක්ස්ටේෂන් මගින් ආවරණ අනුමැතියට යටත්ව මිලදී ගැනීම සිදුකර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | |
|---|---|---|---|---|
| | | පී.සී.වර්ක්ස්ටේෂන් නො.119 බෞද්ධාලෝක මාවත, පුවක්ගස් හන්දිය, කුරුණෑගල | දිමුතු ඔෆිස් ඉක්විප්මන්ට් සප්ලයර්ස් ඇන්ඩ් සර්විසස්, නො.1-4, නීතිඥ කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල | ඔම්මටා ට්‍රේඩ් සෙන්ටර්, නො.58/3, සුමංගල මාවත, පුත්තලම් පාර, කුරුණෑගල |
| 01 | අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ වැටුප් සකස් කිරීම සඳහා භාවිතා කරනු ලබන EPSON LQ 2190 වර්ගයේ මුද්‍රණ යන්ත්‍රයඅළුත්වැඩියාව සඳහා මිල ගණන් | **රු.8500.00** | **රු.16400.00** | **රු.15400.00** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන වැටුප් සකස්කරනු ලබන EPSON LQ 2190 වර්ගයේ මුද්‍රණ යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා රු.8500.00 ක් වන අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.119 බෞද්ධාලෝක මාවත, පුවක්ගස් හන්දිය, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක පී.සී.වර්ක්ස්ටේෂන් මගින් ආවරණ අනුමැතියට යටත්ව මිලදී ගැනීම සිදුකර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-4)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/54 - 04** දරණ යෝජනාව</u>

2022 අයවැය ලේඛනය මගින් අප සභාවේ සුභසාධක සමිතියේ කටයුතු වෙනුවෙන් වෙන්කර ඇති රු. 100,000.00 ක මුදල සුභසාධක සමිතිය වෙත ලබාදීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2022 අයවැය ලේඛනය මගින් අප සභාවේ සුභසාධක සමිතියේ කටයුතු වෙනුවෙන් වෙන්කර ඇති රු. 100,000.00 ක මුදල සුභසාධක සමිතිය වෙත ලබාදීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-5)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/54 - 05 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවේ මහරච්චිමුල්ල උප කාර්යාලයේ වැසිකිලිය සඳහා ඇළුමේනියම් උළුවස්ස සහිත දොරක් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති දොර වීදුරු සහිත දොරක් නිසා එළිමහන් දොරක් සඳහා සුදුසු නොවන බැවින් දෙවන මිල ගණන ඉදිරිපත් කර ඇති නො. 138, නාරම්මල පාර, අලව්ව ලිපිනයේ ක්‍රියාත්මක ග්‍රෑන්ඩ් ඇළුමිනියම් ආයතනය මගින් මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | |
|---|---|---|---|---|
| | | ධම්මික හාඩ්වෙයර්, නාරම්මල පාර, අලව්ව. | ග්‍රෑන්ඩ් ඇළුමිනියම්, නො. 138, නාරම්මල පාර, අලව්ව | සනුලි ඉන්ජිනියරිං, නො.44, නිවාස යොජනා ක්‍රමය, ගිරිඋල්ල පාර, අලව්ව |
| 01 | ඇළුමේනියම් උළුවස්ස සහිත Cladding Board යොදා තැනූ දොර<br>උස - 1800mm<br>පළල - 670mm<br>Box Bar of the Frame - 40mm X 25mm<br>Cladding Board Gage – 3 mm | **රු.14,000.00** | **රු.15,800.00** | **රු.16,900.00** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ මහරච්චිමුල්ල උප කාර්යාලයේ වැසිකිලිය සඳහා ඇළුමේනියම් උළුවස්ස සහිත දොරක් මිලදී ගැනීම සඳහාඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති දොර වීදුරු සහිත දොරක් නිසා එළිමහන් දොරක් සඳහා සුදුසු නොවන බැවින් දෙවන මිල ගණන ඉදිරිපත් කර ඇති නො. 138, නාරම්මල පාර,අලව්ව ලිපිනයේ ක්‍රියාත්මක ග්‍රෑන්ඩ් ඇළුමිනියම් ආයතනය මගින් මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-6)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/54 - 06 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවට අවශ්‍ය රෝද හතරේ ට්‍රැක්ටර් ට්‍රේලරයේ 750 X 16 ප්‍රමාණයේ රිම්, ටියුබ් සහ කොලර් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති මීගමු පාර, රම්මුතුගල, නාරම්මල ලිපිනයේ ක්‍රියාත්මක නාරම්මල ඔටෝ මොටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය මගින් මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | |
|---|---|---|---|---|
| | | ඔටෝ බ්‍රදර්ස් මීගමු පාර, කිවුල්ගල්ල, නාරම්මල | නාරම්මල ඔටෝ මොටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්. මීගමු පාර, රම්මුතුගල, නාරම්මල | ලවනායා එන්ටර්ප්‍රයිසය් (ප්‍රයිවට්) ලිමිටඩ්, මීගමු පාර, වැලිකුඹුර වත්ත, නාරම්මල |
| 01 | 750 X 16 ප්‍රමාණයේ රිම් - 2 | **රු.51,000.00** | **රු.48,000.00** | **රු.53,000.00** |
| 02 | 750 X 16 ප්‍රමාණයේ ටියුබ් - 2 | **රු.11,000.00** | **රු.9,900.00** | **රු.11,700.00** |
| 03 | 750 X 16 ප්‍රමාණයේ කොලර් - 2 | **රු.1,900.00** | **රු.1,600.00** | **රු.2,200.00** |
| එකතුව | | **රු.63,900.00** | **රු.59,500.00** | **රු.66,900.00** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එහි ටයර් දෙකම දිරලා තිබෙන්නේ. ටියුබ් දෙක නැවත ප්‍රයෝජනයට රඳවා ගන්න.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවට අවශ්‍ය රෝද හතරේ ට්‍රැක්ටර් ට්‍රේලරයේ 750 X 16 ප්‍රමාණයේ රිම්, ටියුබ් සහ කොලර් මිලදී ගැනීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති මීගමු පාර, රම්මුතුගල, නාරම්මල ලිපිනයේ ක්‍රියාත්මක නාරම්මල ඔටෝ මොටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය මගින් මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-7)**<u>**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක 06/54 - 07 දරණ යෝජනාව**</u>

අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය සඳහා කාර්යාල මේස සහ පරිගණක මේස මිලදී ගැනීම සඳහාපහත මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර කාර්යාල මේස සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති කොළඹ පාර, වැහැර, කුරුනෑගල ලිපිනයේ ක්‍රියාත්මක කූල්වේ ආයතනය මගින් ද පරිගණක මේස සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.69, කොළඹ පාර, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක දිනපාල ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින් ද මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | | | |
|---|---|---|---|---|---|---|
| | | සී/ස රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව, නො.243, පුත්තලම් පාර, කුරුණෑගල. | රෝ එන්ටර්ප්‍රයිසස් නො.349, අනුරාධපුරය පාර, ගල්ගමුව | ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ්, නො.49/16, අයිස්ලන්ඩ් බිල්ඩිං, ගාලුපාර, කොළඹ - 03 | දිනපාල ප්‍රයිවට් ලිමිටඩ් නො.69, කොළඹ පාර, කුරුණෑගල | කුල්වේ, කොළඹ පාර, වැහැර, කුරුණෑගල |
| 01 | කාර්යාල මේස (Office Table) - MDF 4 X 2 X 2,1/2 | **රු.22,950.00** | **රු.31,456.00** | **රු.33,824.00** | **රු.24,950.00** | **රු.21,700.00** |
| 02 | පරිගණක මේස (Computer Table) 2,1/2 X 1,1/2 X 2,1/2 | **රු.13,530.00** | **රු.15,832.00** | **රු.17024.00** | **රු.9950.00** | **රු.10,600.00** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය සඳහා කාර්යාල මේස සහ පරිගණක මේස මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් කාර්යාල මේස සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති කොළඹ පාර, වැහැර, කුරුනෑගල ලිපිනයේ ක්‍රියාත්මක කුල්වේ ආයතනය මගින් ද පරිගණක මේස සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.69, කොළඹ පාර, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක දිනපාල ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින් ද මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-8)**<u>**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/54 - 08 දරණ යෝජනාව**</u>

අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය පරිගණක උපාංගමිලදී ගැනීම සඳහාපහත මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර UPS සහ Pen Drive – 32GB/64Gb සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො. 480, පුත්තලම් පාර, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක බෙස් එච්.පී.ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින් ද Mouse (**මූසිකය**) සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.243, පුත්තලම් පාර, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක සී/ස රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව මගින් ද, Keyboard (**යතුරු පුවරුව**) සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.60, නුවර පාර, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක හේමැක්ස් කම්පියුටර්ස් ආයතනය මගින් ද මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | | |
|---|---|---|---|---|---|
| | | බෙස් එච්.පී.ප්‍රයිවට් ලිමිටඩ්, නො.480, පුත්තලම් පාර, කුරුණෑගල | කේ.ටී.ඔෆිස් ඔටෝමේෂන් පුද්.සමාගම, නො.310ඊ, මීගමු පාර, කුරුණෑගල | සී/ස රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව, නො.243, පුත්තලම් පාර, කුරුණෑගල. | හේමැක්ස් කම්පියුටර්ස්, නො.60, නුවර පාර, කුරුණෑගල |
| 01 | UPS | **රු.16,500.00 Brand :- EAST (650VA) Warranty:-2 Year** | **රු.16,650.00 Brand :- Kstar (650VA) Warranty:- 1 Year** | **රු.16,500.00 Brand :- SCP (650VA) Warranty:- 1 Year** | **රු.14,750.00 Brand :- EAST (650VA) Warranty:- 1 Year** |
| 02 | Mouse(මූසිකය) | **රු.1,800.00 Brand :- Prolink Warranty:-6 Month** | **රු.950.00 Brand :- Not Mention Warranty:- 1 Year** | **රු.1,450.00 Brand :- Prolink Warranty:- 1 Year** | **රු.1,250.00 Brand :- Micropack Warranty:-6 Month** |
| 03 | Keyboard (යතුරු පුවරුව) | **රු.1,300.00 Brand :- Protech Warranty:-3 Month** | **රු.2,550.00 Brand :- Not Mention Warranty:- 1 Year** | **රු.2,500.00 Brand :- Prolink Warranty:- 1 Year** | **රු.900.00 Brand :- Tech pro Warranty:-6 Month** |
| 04 | Pen Drive – 32GB/64Gb | **32GB - රු.2,450.00 64GB - රු.3,400.00 Brand :- Kingston Warranty:-5 Year** | **32GB - රු.1,950.00 64GB - රු.2,350.00 Brand :- Hikvision Warranty:- 1 Year** | **32GB - රු.2,250.00 64GB- ඉදිරිපත් කර නොමැත Brand :- Kingston Warranty:-3 Year** | **32GB - රු.1,750.00 64GB - රු.1,950.00 Brand :- Hikvision Warranty:-3 Years** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය පරිගණක උපාංග මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් UPS සහ Pen Drive – 32GB/64Gb සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.480, පුත්තලම් පාර, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක බෙස් එච්.පී.ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින් ද Mouse(**මූසිකය**) සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.243, පුත්තලම් පාර, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක සී/ස රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව මගින් ද, Keyboard (**යතුරු පුවරුව**) සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.60, නුවර පාර, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක හේමැක්ස් කම්පියුටර්ස් ආයතනය මගින් ද මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-9)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/54 - 09 දරණ යෝජනාව</u>**

අලව්ව බෝධිරාජ බෞද්ධ මධ්‍යස්ථානයේ පිවිසුම් මාර්ගයට අදාල තොරණ මුද්‍රණය කිරීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ආඩියාදෙණිය, මහරච්චිමුල්ල ලිපිනයේ ක්‍රියාත්මක

විජේවර්ධන ආයතනය මගින් ආවරණ අනුමැතියට යටත්ව මිලදී ගැනීම සිදුකර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | |
|---|---|---|---|---|
| | | සරණ මුද්‍රණ ආයතනය නුගවෙල පුරාණ විහාරය නුගවෙල, මහරච්චිමුල්ල | විජේවර්ධන ප්‍රින්ටර්ස් ආඩියාදෙණිය මහරච්චිමුල්ල. | ප්‍රින්ටෝ කුරුණෑගල පාර, මහරච්චිමුල්ල |
| 01 | **පිවිසුම් තොරණේ උඩ කොටස සඳහා 226"X 24"ප්‍රමාණයේ Digital Print Out** | **රු.7800.00** | **රු.7100.00** | **රු.8200.00** |
| 02 | **පිවිසුම් තොරණේ කණු දෙක සඳහා 132"X 18"ප්‍රමාණයේ Digital Print Out** | **රු.6500.00** | **රු.6200.00** | **රු.7300.00** |
| **එකතුව** | | **රු.14300.00** | **රු.13300.00** | **රු.15500.00** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව බෝධිරාජ බෞද්ධ මධ්‍යස්ථානයේ පිවිසුම් මාර්ගයට අදාල තොරණ මුද්‍රණය කිරීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ආඩියාදෙණිය, මහරච්චිමුල්ල ලිපිනයේ ක්‍රියාත්මක විජේවර්ධන ආයතනය මගින් ආවරණ අනුමැතියට යටත්ව මිලදී ගැනීම සිදුකර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-10)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/54 - 10** දරණ යෝජනාව</u>

අලව්ව ප්‍රාදේශීය සභාව සතු PC - 0366 අංක දරණ කැබ් රථයේ රිවස් කැමරාව අක්‍රිය වී ඇති බැවින් එය අළුත්වැඩියා කිරීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති කොළඹ පාර, වැහැර, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක සම්පත් ලෙදර් ඇන්ඩ් බොඩි කිට්ස් ආයතනය මගින් අළුත්වැඩියා කිරීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | |
|---|---|---|---|---|
| | | නුවන් ඔටෝ පාර්ට්ස්, බෝයගනේ | සුසන්ත ආර්ට්ස්, උහුමීය | සම්පත් ලෙදර් ඇන්ඩ් බොඩි කිට්ස්, කොළඹ පාර, වැහැර, කුරුණෑගල |
| 01 | **DVD කාර් සෙට් එක සඳහා** | **රු.29000.00** | **රු.31000.00** | **රු.28000.00** |
| 02 | **රිවස් කැමරාව සඳහා** | **රු.5250.00** | **රු.6500.00** | **රු.4500.00 (මාස 06 ක වගකීම)** |

| | | | | |
|---|---|---|---|---|
| 03 | සෙට් එක සවිකිරීම සඳහා | **රු.2500.00** | **රු.3500.00** | **රු.2000.00** |
| 04 | කැමරාව සවි කිරීම සඳහා | **රු.1350.00** | **රු.1500.00** | **රු.1200.00** |
| එකතුව | | **රු.38100.00** | **රු.42500.00** | **රු.35700.00** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාව සතු PC - 0366 අංක දරණ කැබ් රථයේ රිවස් කැමරාව අක්‍රිය වී ඇති බැවින් එය අළුත්වැඩියා කිරීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති කොළඹ පාර, වැහැර, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක සම්පත් ලෙදර් ඇන්ඩ් බොඩි කිට්ස් ආයතනය මගින් අළුත්වැඩියා කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-11)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/54 - 11 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවේ ZA-5298 දරණ මෝටර් ග්‍රේඩරය සඳහා අවශ්‍ය ඇම්පියර් 120 බැටරි දෙකක් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.155, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ - 14 ලිපිනයේ ක්‍රියාත්මක ක්‍රවුන් ටයර් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය මගින් මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | |
|---|---|---|---|
| | | ක්‍රවුන් ටයර් (ප්‍රයිවට්) ලිමිටඩ්, නො.155, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ - 14 | ඉන්ද්‍රා මෝටර් ස්පෙයාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, නො.43 ඩී, ඩී.එස්.සේනානායක වීදිය, මහනුවර. |
| 01 | **ඇම්පියර් 120 බැටරි** | **රු. 88440.00**<br>**Exide**<br>**Warrenty:- 1"1/2 Years** | **තොග නොමැති බව දන්වා ඇත** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ ZA-5298 දරණ මෝටර් ග්‍රේඩරය සඳහා අවශ්‍ය ඇම්පියර් 120 බැටරි දෙකක් මිලදී ගැනීම සඳහාඅවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.155, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ - 14 ලිපිනයේ ක්‍රියාත්මක ක්‍රවුන් ටයර් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය මගින් මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**(05-12)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/54 - 12 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ වීථි ලාම්පු සඳහා යොදනු ලබන 23W CFL බල්බ් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් **Orange** සන්නාමය සහිත 23w CFL බල්බ්,

Bay 12-13, Trace Expert city, මරදාන පාර, කොළඹ 10 ලිපිනයේ ක්‍රියාත්මක ඔරෙල් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය මගින් මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍යභාසේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඔරෙල් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්, Bay 12-13, Trace Expert city, මරදාන පාර, කොළඹ 10 | සුගත් ඉලෙක්ට්‍රිකල්ස්, නො.620/2බී, දරනාගම, දෙලගොඩ | ලෝටස් ට්‍රේඩ්වේස්, නො.79-1/4, ලයිට් ප්ලාසා, පළමු මහල, පළමු හරස් වීදිය, කොළඹ 11 | ඇට්ලස් ඉලෙක්ට්‍රිකල්ස්, නො.72 ඒ, යටිනුවර වීදිය, මහනුවර | කේ.එස්. ද සිල්වා ඇන්ඩ් සන්, 55, මහ වීදිය, කුරුණෑගල | මිෂෙලි ඉලෙක්ට්‍රිකල්ස්, නො.112, තොඩුවාව, මහවැව | NMI ඉන්ප්‍රා (ප්‍රයිවට්) ලිමිටඩ්, නො.413, හැව්ලොක් රෝඩ්, කොළඹ 06 | සිල්වර්ලයින් ඉලෙන්ට්‍රිකල්ස් ඉංජිනායරිං කම්පණි, නො.167, අම්බලම හන්දිය, සියඹලාපේ. |
| 01 | **C F L** බල්බ් 23**W– Wireman** (බල්බයේ “AlawwaP.S” ලෙස මුද්‍රණය කර ලබාදිය යුතුය) | | | | | | | | **රු.970.00 Warrenty- 12 Months** |
| 02 | **C F L** බල්බ් 23**W - Orange** (බල්බයේ “AlawwaP.S” ලෙස මුද්‍රණය කර ලබාදිය යුතුය) | **රු.1071.00 Warrenty- 18 Months** | **රු.998.00 Warrenty- 15 Months** | **රු.1850.00 Warrenty-** 12 Months | **රු.970.00 Warrenty- 12 Months (Without Print)** | **රු.1600.00 Warrenty- 12 Months (Alawwa PS – Sticker)** | **රු.839.50 Warrenty- 12 Months** | | **රු.960.00 Warrenty- 12 Months** |
| 03 | **LED** බල්බ් 15**W– Green** (බල්බයේ “AlawwaP.S” ලෙස මුද්‍රණය කර ලබාදිය යුතුය) | | | | | | | **රු.1767.50 Warrenty- 24 Months** | |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි ලාම්පු සඳහා යොදනු ලබන 23W CFL බල්බ් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් **Orange** සන්නාමය සහිත 23**W** CFL බල්බ්, Bay 12-13, Trace Expert city, මරදාන පාර, කොළඹ 10 ලිපිනයේ ක්‍රියාත්මක ඔරෙල් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය මගින් මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-13)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/54 - 13 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවේ LL– 6946 දරණ ටිපර් රථය සඳහා අවශ්‍ය 900 X 20 ප්‍රමාණයේ ටයර්, ටියුබ් සහ කොලර් මිලදී ගැනීම සඳහා පහත මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර එම මිල ගණන් තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත යොමු කර එම කමිටුවේ නිර්දේශ මත මිලදී ගැනීම සුදුසු බව යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍යභාසේ වාවිස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | බටේපොල ටයර් හවුස් කුරුණෑගල පාර උයන්වත්ත, නාරම්මල | සුම්ඩැග් ටයර් කම්පණි ප්‍රයිවට් ලිමිටඩ් මීගමු පාර, | සී/ස රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව, නො.243, පුත්තලම් පාර, කුරුණෑගල. | අමිල අබේනායක කම්පනි(ප්‍රයිවට්)ලිමිටඩ් නො.258, මීගමු පාර,කුරුණෑගල | රෝහණ එන්ටර්ප්‍රයිසස් කුරුණෑගල (පුද්) සමාගම, නො.263, කොළඹ පාර, කුරුණෑගල | ක්‍රවුන් ටයර් (ප්‍රයිවට්) ලිමිටඩ් නො.155 සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14 | පෙරේරා ටයර් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්, 773, නව නුවර පාර, මාලබේ. | ඉන්ද්‍රා මෝටර්ස් ස්පෙයාර්ස් (ප්‍රයිවට්)ලිමිටඩ්, 43 ඩී.එස්.සේනානායක වීදිය, මහනුවර |
| 01 | 900 X 20 Tyre | **රු.80500.00 Ceat - Ribac Warrenty- Three Years** | **රු.86,659.00 Ceat (XL super 16PR) Warrenty- one Year** | **රු.80500.00 16PR Ferentino Warrenty- Not Mention** | **රු.83,000.00 Ceat –Sri Lanka (XL super) Life TimeWarrenty Only For Production Falts** | **රු.93200.00 Ceat Warrenty- Up to 35000 Km** | **රු.80,000.00 Ceat 14PR Warrenty- one Years රු.89,900.00 Ceat 16PR Warrenty- one Years** | **රු.87,500.00 Ceat 16PR XL Super Warrenty-one Years Warrenty Only For Manufacturing Falts** | **රු.80500.00 Ceat Warrenty- Not Mention** |
| 02 | 900 X 20 Tube | **රු.6450.00 Lotus Warrenty- Three Years** | **රු.7200.00 DSI Warrenty- Not Mention** | **රු.6555.00 India Warrenty- Not Mention** | **රු.6500.00 ARL Warrenty Only For Production Falts** | **රු.6790.00 Arpico Warrenty- Not Mention** | **රු.6300.00 Maxride Warrenty- Six Month** | **රු.6200.00 Indian Warrenty-Not Mention** | **රු.8900.00 Warrenty- Not Mention** |
| 03 | 900 X 20 Coller | **රු.900.00 Warrenty-Six Months** | **රු.900.00 Warrenty- Not Mention** | **රු.1124.25 Flap-Sri lanka Warrenty- Not Mention** | **රු.950.00 Flap- DMW Warrenty Only For Production Falts** | **රු.990.00 Arpico Warrenty- Not Mention** | **රු.900.00 Passon Warrenty- Six Months** | **රු.950.00 Flap-Sri lanka Warrenty-Not Mention** | **රු.1350.00 Warrenty- Not Mention** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ LL– 6946 දරණ ටිපර් රථය සඳහා අවශ්‍ය 900 X 20 ප්‍රමාණයේ ටයර්, ටියුබ් සහ කොලර් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත යොමු කර එම කමිටුවේ නිර්දේශ මත මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-14)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක 06/54 - 14 දරණ යෝජනාව</u>

අලව්ව ප්‍රාදේශීය සභාව හා මහජන පුස්තකාලය එක්ව සාහිත්‍ය මාසය හා කියවීමේ මාසය සැමරීමේ වැඩසටහනක් සංවිධානය කර ඇති අතර සාහිත්‍ය මාසය හා කියවීමේ මාසය වෙනුවෙන් 2022 වාර්ෂික අයවැය ලේඛනයේ 6.6-607-7 වැය ශීර්ෂය යටතේ රු. 100,000.00 ක මුදලක් වෙන්ව ඇති බැවින් පහත වැඩසටහන් දෙක වෙනුවෙන් ඇස්තමේන්තු ගත මුදල වන රු. 90,400.00 ක මුදල අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

| කියවීමේ මාසය වෙනුවෙන් වියදම් ඇස්තමේන්තුව | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විස්තරය | ඒකකයක මිල | ප්‍රමාණය | මුදල (රු) |
| 01 | කණ්ඩායම් 4ක් සඳහා සංග්‍රහය (එක් කණ්ඩායමක 6 බැගින්) 6×4 = 24 | 300.00 | 24 | 7200.00 |
| 02 | සහතික පත්‍ර මුද්‍රණය | 100.00 | 30 | 3000.00 |
| 03 | ජයග්‍රාහී කණ්ඩායම සඳහා ත්‍යාග<br>අනු ශූරතාවය සඳහා ත්‍යාග | 2000.00<br>1000.00 | 06<br>06 | 12000.00<br>6000.00 |
| 04 | පැමිණෙන පිරිස් සඳහා සංග්‍රහය | 150.00 | 50 | 7500.00 |
| 05 | වෙනත් (සැරසිලි කටයුතු හා විනිශ්‍ය මණ්ඩල සඳහා ත්‍යාග) | | | 5000.00 |
| මුළු එකතුව | | | | 40700.00 |

| සාහිත්‍ය මාසය වෙනුවෙන් වියදම් ඇස්තමේන්තුව | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විස්තරය | ඒකකයක මිල | ප්‍රමාණය | මුදල (රු) |
| 01 | <u>**කණිෂ්ඨ අංශය**</u><br>පුස්තකාල ත්‍රිත්වයේ 1 හා 2 ස්ථාන ගත් දරුවන් සඳහා<br>කථික තරඟ } සංග්‍රහ කටයුතු<br>පද්‍ය ගායනා }<br><u>**ජ්‍යෙෂ්ඨ අංශය**</u><br>පුස්තකාල ත්‍රිත්වයේ 1 හා 2 ස්ථාන ගත් දරුවන් සඳහා<br>කථික තරඟ } සංග්‍රහ කටයුතු<br>පද්‍ය ගායනා } | 300.00<br><br>300.00 | 12<br><br>12 | 3600.00<br><br>3600.00 |
| | <u>**සහතික පත්‍ර**</u><br>පුස්තකාල ත්‍රිත්වයේ තරඟ වදින චිත්‍ර, පද්‍ය ගායනා, කථික, ගද්‍ය රචනා තරඟ සඳහා<br>අදියර 01<br>අදියර 02 | 100.00<br>100.00 | 100<br>50 | 10000.00<br>5000.00 |
| | පැමිණෙන පිරිස් හා විනිශ්චය මණ්ඩලය හා සංග්‍රහය | 150.00 | 50 | 7500.00 |

| | | | | |
|---|---|---|---|---|
| | <u>ත්‍යාග සඳහා</u><br>(ප්‍රාථමික, කණිෂ්ඨ,ජොෂ්ඨ)<br>චිත්‍ර 01 වන ස්ථානය<br>ගද්‍ය රචනා 01 වන ස්ථානය<br>කථික 01 වන ස්ථානය<br>පද්‍ය ගායනා 01වන ස්ථානය | <br><br>2000.00<br>2000.00<br>2000.00<br>2000.00 | <br><br>03<br>02<br>02<br>02 | <br><br>6000.00<br>4000.00<br>4000.00<br>4000.00 |
| | <u>වෙනත්</u> | | | 2000.00 |
| මුළු එකතුව | | | | **49700.00** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව සාහිත්‍ය මාසය හා කියවීමේ මාසය වෙනුවෙන් 2022 වාර්ෂික අයවැය ලේඛනයේ 6.6-607-7 වැය ශීර්ෂය යටතේ රු. 100,000.00 ක මුදලක් වෙන්ව ඇති බැවින් ඉහත වැඩසටහන් දෙක වෙනුවෙන් ඇස්තමේන්තු ගත මුදල වන රු. 90,400.00 ක මුදල අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-15)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා විසින් කරනු ලබන අංක 06/54 - 15 දරණ යෝජනාව</u>**
2021 හා 2022 වර්ෂයට අදාල මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ඉදිරිපත් කර ඇති සංවර්ධන යෝජනා වෙනුවට පහත පරිදි එම යෝජනා සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**<u>2021 මන්ත්‍රී ප්‍රතිපාදන</u>**

- හගවත්ත පිංකොටුව සිට ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීම
- වඩුවාව ඉහලවෙල මාර්ගය සංවර්ධනය කිරීම

**<u>2022 මන්ත්‍රී ප්‍රතිපාදන</u>**
පොරමඩල ප්‍රාථමික විද්‍යාලය හරහා බඹරගල දක්වා මාර්ගය පස් පුරවා සංවර්ධනය කිරීම - රු. 150,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත  2021 හා 2022 මන්ත්‍රී ප්‍රතිපාදන සඳහා ඉහත සඳහන් ලෙස සංවර්ධන යෝජනා සංශෝධනය කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**06.** **<u>ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම</u>**

(06.1) - අග්බෝව දංගොල්ලවත්ත මාර්ගයේ බෝක්කුවේ කොන්ක්‍රීට් ලැල්ල දැමීම - රු. 105,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඉහත ඇස්තමේන්තුව පිළිගැනීම සුදුසු බවට යෝජනා කරනවා. එමෙන්ම මේ මාර්ගය විශාල පිරිසක් භාවිතා කරන අත්‍යාවශ්‍යම මාර්ගයක්. මේ මාර්ගය මීට වඩා පුළුල් කර ගැනිමේ අවශ්‍යතාව ගම්වාසීන්ට තිබෙනවා. ඒ නිසා තාක්ෂණ නිලධාරින් මේ මාර්ග

පරික්ෂාවට යන විට මන්ත්‍රීවරුන්ට දැනුවත් කිරිමක් කරන්න කියල මම ඉල්ලිමක් කරනවා. මොකද මෙම මාර්ගයට වෙන් කරන ප්‍රතිපාදන වලටම ඒ මුදලුත් යොදවල එසේ නැත්නම් ද්‍රව්‍ය ආධාර යොදවල සාර්ථකව එම වැඩ කටයුතු නිමකර ගැනිමට හැකියාව ලැබෙනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
අපේ ඇස්තමේන්තුවට අනුව හැදෙන්නේ කොන්ක්‍රීට් ලැල්ල විතරයි. අපිට තිබෙන මුදල් ප්‍රමාණය මත තමයි අපි ඒ තීන්දුව ගත්තේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා. එමෙන්ම කොට්ඨාශ භාර මන්ත්‍රීතුමා මේ සඳහා සම්බන්ධ වෙලා අධාර ද්‍රව්‍යාධාර ලබා දෙනවා නම් බර වාහනවලට ගමන් කිරීමට හැකි වන ආකාරයට මාර්ගය සකස් කිරීමට හැකි වෙනවා. මේ විදියට ගරු මන්ත්‍රීතුමන්ලා සහභාගී වෙනවා නම් ලොකු වැඩ කොටසක් ගම්වලට කිරීමට හැකි වෙනවා. එතුමා ගෙනාවේ හොඳ යෝජනාවක්. එම යෝජනාවත් මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
මේ ඇස්තමේන්තුව හදලා තිබෙන්නේ කොන්ක්‍රීට් ලැල්ල වෙන ස්ථානයක හදලා අදාල ස්ථානයට ගෙනවිත් තැබීමටයි. නමුත් එහෙම තිබ්බම වාහන ගමන් කරන විට අයින කැඩීමට තිබෙන ඉඩ ප්‍රමාණය වැඩියි. ඒ නිසා පාරට බහින එම ස්ථානයේ ගැට්ටක් ඇති නොවන ආකාරයට අදාල ස්ථානය සකස් කරන්න පුළුවන් නම් හොඳයි.

ඒ අනුව, ඉහත සංවර්ධන කටයුත්ත සඳහා අදාල ඇස්තමේන්තුව පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

## 07.නිවාඩු ලිපි ඉදිරිපත් කිරිම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අද දින සභාවට සහභාගී නොවූ පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාහට අද දිනය නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

## 08.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### (08.1) මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2022.08.30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2022.08.30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.08.30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(08.2)</u>**<u>නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව</u>

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2022.08.30 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2022.08.30 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.08.30 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(08.3)</u>**<u>ප්‍රසම්පාදනකාරක සභා රැස්වීම් වාර්තාව</u>

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2022.07.28 දින පැවති ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2022.07.28 දින පැවති ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.07.28 දින පැවති ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(08.4)</u>**<u>කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව</u>

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2022.09.06 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2022.09.06 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.09.06 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාවේ ගැටළුවක් තිබෙනවා. අංක XV දරණ කරුණ යටතේ මේ ප්‍රාදේශීය සභාව සතු මාර්ග අපේ ගරු මහජන නියෝජිතයන් සභාවට යොමු කර දේශපාලන අධිකාරියේ නායකයා ළඟට ගෙන ගොස් විෂයභාර ඇමතිතුමා මගින් මුදල් අරගෙන පාර හදන්නේ. මේව මොකටද මාර්ග සංවර්ධන අධිකාරියට යොමු කරන්නේ. මේ මනුස්සයා මාසයක් හරි දෙකක් හරි, අවුරුද්දක් හරි ගල් කඩාගෙන සියල්ලත් අරගෙන යයි. අවසානෙ මේ සභාවයි අපහසුතාවයට පත්වෙන්නේ. මහජන නියෝජිතයන් මේ සභාව සතු මාර්ගය පිළිබඳව තීන්දු තීරණ ගනිද්දි සභාව සම්බන්ධ විය යුතුයි. මාර්ග සංවර්ධන අධිකාරියට හරි  පළාත් මාර්ග සංවර්ධන  අධිකාරියට හරි  අහන්න යනව නම් එයින් වෙන්නෙ සභාව හැල්ලු වෙන එකයි. මේ පාරවල් හදන්න මහජන නියෝජිතයන් පුදුම කැප කිරිමක් කරන්නෙ. ගමේ පාරවල් වල අයිතිය තිබෙන්නෙ ප්‍රාදේශීය සභාවට. මේ පාරවල් වල මොනව හරි වුනොත්  ගමේ මිනිස්සු අහන්නෙ ප්‍රදේශයේ මහජන නියෝජිතයාගෙන්.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
මේ ප්‍රශ්නය කර්මාන්ත කමිටුවේදී කතා කලා. මේ මාර්ග හදන විට නියමිත ප්‍රමිතියට මේ පාර හදනවද කියන එක පිළිබඳව මෙන්ම කාපට් කරනවා නම් ඒ ගමේ පවතින පාරවල් වලට මෙය ඔරොත්තු දෙනවද කියන එක පිළිබඳව ඒ ගමේ අය දැනගත යුතුයි. ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිත ව්‍යාපාර සම්බන්ධයෙන් ගමේ නියෝජිතයට දැනුමක් තිබිය යුතුයි. එයටත් ගැලපෙන ආකාරයට මෙම මාර්ග සෑදිය යුතුයි. මේ ප්‍රදේශයේ තිබෙන ව්‍යාපාර පිළිබඳව සහ ඒවාට ඔරොත්තු දෙන ආකාරයට පාර හදාගන්නමේ පාරවල් හදන්න ගන්න අයයි, ප්‍රතිලාභ ලබන අයයි, නායකත්වය ගන්න අයයි හැමෝම දැනගන්න ඕනෑ. ඒ පිළිබඳවයි කමිටුවේ සාකච්ඡා කෙරුනේ.දිගින් දිගටම තර්ක කරනව මාර්ග සංවර්ධන අධිකාරියෙන් හදල තියෙන්නේකියල. ඒකට අපේ කාර්මික නිලධාරිනුත් සහභාගී වෙනව. මේව නොදැන කරන වැඩ නෙවෙයි. මේව එහාට පටලවනවා. ඒ පටලැවිල්ල තමයි මේ දිගින් දිගමට ඇවිල්ලා තිබෙන්නේ. ඒ ගල් වලේ රැඳවුම් මුදලක් අපි ලඟ තිබෙන බවත් පාර කැඩිල තිබෙනවා නම් ඒ රැඳවුම් මුදල්වලින් හදන්න පුළුවන් බවත් අදාල වෙලාවට සභාව දැනුවත් කරන්න කියලත් ඒ වෙලාවෙ අපේ ලේකම්තුමිය කීවා.මොකද ඒ ව්‍යාපාරයට සරිලන රැඳවුම් මුදලක් තියාගෙන තමයි බලපත්‍රය ලබා දිය යුත්තේ. එය මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දෙන්න කීවේ මාර්ගය ඉක්මනින්ම කඩා වැටෙන්න හේතුව සම්බන්ධයෙන් ඒ අයගෙ දැක්ම මොකක්ද කියන එක පිළිබඳව දැනගැනිමටයි.

## 09. ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව, ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය හා ආදායම් පුරෝකථන වාර්තාව සහ ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාව ඉදිරිපත් කිරීම

### 9.1 ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 අගෝස්තු මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 අගෝස්තු මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 අගෝස්තු මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට ඒකමතිකව සභා සම්මතවිය.

**9.2 ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 අගෝස්තු මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 අගෝස්තු මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 අගෝස්තු මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**9.3 2022/08/01 දින සිට 2022/08/31 දින දක්වා ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022/08/01 දින සිට 2022/08/31 දින දක්වා ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

| අනු අං: | වවුචර් අංකය | ආදායකයා | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|
| 1 | 919 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | පොදු ගිණුමෙන් කර්මාන්ත ගිණුමට මුදල් මාරු කිරීම. | 2,000,000.00 |
| 2 | 920 | දිසානායක එන්ටර්ප්‍රයිසස් | Z.A. 5067 බැකෝ ලෝඩරය සඳහා හයිඩ්‍රොලික් ඔයිල් මිලදී ගැනීම | 45,000.00 |
| 3 | 921 | සී.බී.එල්. ග්ලෝබල් ෆුඩ්ස් ලිමිටඩ් | 2022.07.12 දින පැවැත්වූ ක්‍රීඩා තරගය සඳහා තැන්පත් කල මුදල් ආපසුගැනීම | 5,000.00 |
| 4 | 922 | ඔරියන්ට් මෝටර් සෙන්ටර් | සී.බී. 8367 අත්ට්‍රැක්ටරය සඳහා බෙල්ට් 02ක් මිලදී ගැනිම | 2,700.00 |
| 5 | 923 | එච්.බී. විනිතා ප්‍රියමානි මිය | 2022 ජූලි ගරු සභාපතිතුමියගේ පුද්ගලික සහකාර දීමනාව | 22,000.00 |
| 6 | 924 | ධම්මික හාඩ්වෙයාර් | බෝයවලාන පුස්තකාල භූමියේ ගෙවතු වගා කටයුතු සඳහා ජලය සැපයීමට අවශ්‍යඋපකරණ මිලදී ගැනීම | 4,630.00 |

| | | | | |
|---|---|---|---|---|
| 7 | 925 | ඩී.ඒ. වසන්ත දසනායක මයා | සෞඛ්‍ය අංශය සඳහා කොසු ඉදල් මිලදී ගැනීම | 12,000.00 |
| 8 | 926 | කේ.ඒ. අජන්තා මිය | ගලි බවුසර් කුලිය ආපසු ගෙවීම | 3,500.00 |
| 9 | 927 | රියල් පීසී සොලූෂන් | ප්‍රජා සංවර්ධන අංශයේ පරිගණකය අළුත් වැඩියාව | 1,000.00 |
| 10 | 928 | ගුණසිරි කූල් හවුස් | 2022 ජූනි ප්‍රධාන කාර්යාලයේ පුවත්පත් බිල් පියවීම | 950.00 |
| 11 | 929 | ගුණසිරි කූල් හවුස් | 2022 ජූනි අලව්ව පුස්තකාලයේපුවත්පත් බිල් පියවීම | 6,900.00 |
| 12 | 930 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 2022 ජූනි මහරච්චිමුල්ල උප කාර්යාලයේ දුරකථන බිල්පත් පියවීම | 1,248.61 |
| 13 | 931 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 2022 ජූනි අලව්ව ප්‍රධාන කාර්යාලයේ දුරකථන බිල්පත් පියවීම | 3,189.33 |
| 14 | 932 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 2022 ජූනි අලව්ව ප්‍රධාන කාර්යාලයේ අන්තර්ජාල පහසුකම සම්බන්ධදුරකථනයේදුරකථන බිල්පත පියවීම | 4,540.35 |
| 15 | 933 | සී/ස ලංකා බෙල් සමාගම | 2022 ජූනි කැප්පිටිවලාන උප කාර්යාලයේ දුරකථන බිල්පත් පියවීම | 612.57 |
| 16 | 934 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 ජූනි ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ජල බිල්පත් පියවීම | 2,824.64 |
| 17 | 935 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 ජූනි අලව්ව ප්‍රධාන කාර්යාලයේ ජල බිල්පත් පියවීම | 3,105.01 |
| 18 | 936 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 ජූනි අලව්ව මහජන ක්‍රීඩාංගනයේ ජල බිල්පත් පියවීම | 1,522.64 |
| 19 | 937 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 ජූනි අලව්ව මහජන පුස්තකාලයේ ජල බිල්පත් පියවීම | 1,022.56 |
| 20 | 938 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 ජූනි අලව්ව දුම්රියපොල අසලජල සැපයුමේ ජල බිල්පත් පියවීම | 468.53 |
| 21 | 939 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 ජූනි කුරුණෑගල පාර ජල සැපයුමේ ජල බිල්පත් පියවීම | 959.47 |
| 22 | 940 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 ජූනි අලව්ව බස් නැවතුම්පොලපොදු වෙළඳ සංකීර්ණයේ ජල සැපයුමේ ජල බිල්පත් පියවීම | 1,679.63 |
| 23 | 941 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 ජූනි අලව්ව බස් නැවතුම්පොලඅසල ජල සැපයුමේ ජල බිල්පත් පියවීම | 490.93 |
| 24 | 942 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 ජූනි අලව්ව තාවකාලික සතිපොලජල බිල්පත් පියවීම | 6,391.57 |
| 25 | 943 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූලි ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් පියවීම | 2,399.40 |
| 26 | 944 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූනි බුජ්ජොමුව සායන මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් පියවීම | 294.90 |
| 27 | 945 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූලි බුජ්ජොමුව සායන මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් පියවීම | 258.30 |
| 28 | 946 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූනි කිරිවානාපොල සායන මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් පියවීම | 294.90 |
| 29 | 947 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූනි මහරච්චිමුල්ල උප කාර්යාලයේ විදුලි බිල්පත් පියවීම | 642.60 |
| 30 | 948 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූලි අලව්ව ප්‍රධානකාර්යාලයේ විදුලි බිල්පත් පියවීම | 10,111.20 |

| | | | | |
|---|---|---|---|---|
| 31 | 949 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූලි අලව්ව ප්‍රජා ශාලාවේවිදුලි බිල්පත් පියවීම | 1,283.10 |
| 32 | 950 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූලි බෝයවලාන පුස්තකාලයේවිදුලි බිල්පත් පියවීම | 3,387.60 |
| 33 | 951 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූලි අලව්ව මහජනපුස්තකාලයේවිදුලි බිල්පත්පියවීම | 1,447.80 |
| 34 | 952 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූනි මල්පිටිය සුධම්ම පෙර පාසැලේ විදුලි බිල්පත් පියවීම | 331.50 |
| 35 | 953 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූලි අලව්ව පොදු වෙළඳ සංකීර්ණයේ විවෘත ආලින්ද 1 විදුලිබිල්පත් පියවීම | 3,113.10 |
| 36 | 954 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූලි අලව්ව පොදු වෙළඳ සංකීර්ණයේ විවෘත ආලින්ද 2 විදුලිබිල්පත් පියවීම | 1,740.60 |
| 37 | 955 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූලි අලව්ව තාවකාලිකසතිපොළ විදුලි බිල්පත් පියවීම | 5,126.10 |
| 38 | 956 | ඩී.ඒ. සෙනවිරත්න මයා | ගමන් වියදම් | 2,800.00 |
| 39 | 957 | පී.කේ. රාමචන්ද්‍රන් මයා | ගමන් වියදම් | 2,800.00 |
| 40 | 958 | චතුරිකා පියසුමන මිය | 2022.07.28 ඉන්ධන ලබා ගැනීම පිළිබඳසාකච්ජාව සඳහා අතින් දැරූ සංග්‍රහ වියදම් ලබාගැනීම. | 950.00 |
| 41 | 959 | ආර්.එම්.කේ. රත්නායක මිය | මහ සභාව සංග්‍රහ වියදම් සඳහා අතින් දැරූ වියදම් ලබා ගැනීම | 290.00 |
| 42 | 960 | සුනිල් ප්‍රේමරත්න මයා | අතිකාල දීමනා - 2022 ජූනි | 6,717.00 |
| 43 | 961 | ඩබ්.ඉරේෂා ප්‍රේමරත්න මිය | ගමන් වියදම් | 1,780.00 |
| 44 | 962 | ඩබ්.ඒ. විජේසිංහ මයා | ගමන් වියදම් | 1,602.00 |
| 45 | 963 | කේ.එම්. වසන්ත කුමාර මයා | ගමන් වියදම් | 2,700.00 |
| 46 | 964 | ර්.එම්.එස්.කේ. ඒකනායක මයා | ගමන් වියදම් | 700.00 |
| 47 | 965 | උපාලි තිලකරත්න මයා | අතිකාල දීමනා - 2022 ජූනි | 5,496.00 |
| 48 | 966 | ඩබ්.ඒ.සී.ජේ. වික්‍රමාරච්චි මිය | බෝයවලාන පුස්තකාල භූමියේ පැල වගාව සඳහා පොහොර ලබා ගැනීමට අතින්දැරූ වියදම් | 2,000.00 |
| 49 | 969 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022.08.09 දින පවත්වන මහ සභා රැස්වීමේ සංග්‍රහ වියදම් සඳහාඅත්තිකාරම් | 22,000.00 |
| 50 | 970 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022 අගෝස්තු සභික දීමනා | 600,000.00 |
| 51 | 971 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම - 2022.07.25 එල්.එම්. 5623 ,ආර්.බී. 3571 ,ආර්.ඩී. 9440 | 107,800.00 |
| 52 | 972 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම - 2022.07.06 ආර්.ඩී. 9440 සඳහා එන්ජින් ඔයිල්ලීටර් 2ක් මිලදී ගැනීම | 4,400.00 |
| 53 | 973 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම - 2022.07.15 ආර්.ඩී. 9440 සඳහා එන්ජින් ඔයිල්ලීටර් 2ක් මිලදී ගැනීම | 2,200.00 |

| | | | | |
|---|---|---|---|---|
| 54 | 975 | රෙජිස්ට්‍රාර් ජෙනරාල් | මුද්දර ගාස්තු උප ලේඛන සැකසීම සඳහා ගාස්තු ගෙවීම (2020 ජූලි සිට දෙසැම්බර්) | 81,600.00 |
| 55 | 976 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022 ජූලි දෛනික වැටුප් ගෙවීම | 609,494.41 |
| 56 | 977 | ඇවන්ස්මාර්ට් ඉංජිනියරින් | Z.A. 5062 බැකෝ ලෝඩරය සේවාකිරීම | 152,789.03 |
| 57 | 978 | ඇවන්ස්මාර්ට් ඉංජිනියරින් | Z.A. 5062 බැකෝ ලෝඩරයඅළුත්වැඩියා කිරීම | 157,923.00 |
| 58 | 979 | ඩබ්.ඩී. කුමාර මයා | 2022 ජූලි රථ ගාල් ගාස්තු 25% දීමනාව | 4,637.50 |
| 59 | 980 | එම්.එම්. තෝමස් ජයකඩු මයා | 2022 ජූනි අලව්ව තාවකාලික සතිපොල භූමිය සඳහා බදු කුලී ගෙවීම | 50,000.00 |
| 60 | 981 | ටවර් හෝල් රගහල පදනම | කතෘ ප්‍රකාශන මිලදී ගැනීම | 3,013.50 |
| 61 | 982 | ජී.ආර්.සි. විමලසේන මයා | අලව්ව ජනරජ මාවතේ අංක 15 ස්ථානය සඳහා එන්.කේ.විජයරත්න මයා විසින්තැන්පත් කරන ලද ගෙවල් කුලී මුදල් ආපසු ගෙවීම. | 7,200.00 |
| 62 | 983 | වයි.එම්.එම්.ජීවාංගනී මිය | සැලසුම් කමිටු ගමන් වියදම් | 1,320.00 |
| 63 | 984 | ධම්මික හාඩ්වෙයාර් | වාහන සඳහා අවශ්‍ය උපාංග මිලදී ගැනීම | 1,050.00 |
| 64 | 985 | සීවලී මෝටර්ස් | 52-8668 කැබ් රථය අළුත් වැඩියාව | 2,000.00 |
| 65 | 986 | සීවලී මෝටර්ස් | ආර්.ඩී. 9440 ට්‍රැක්ටරය අළුත් වැඩියාව | 32,000.00 |
| 66 | 987 | ඉන්ද්‍රජිත් එස්.ආර්. අමරසේකර මයා | නීතිඥ ගාස්තු ගෙවීම - (නඩු අංක 55046) | 35,000.00 |
| 67 | 988 | පියසේන විජේසූරිය මයා | 2022 ජූනි මහරච්චිමුල්ල පුස්තකාලයේ පුවත්පත් බිල් පියවීම | 7,740.00 |
| 68 | 989 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 ජූලි කුරුණෑගල පාර අසල ජල සැපයුමේ ජල බිල්පත් පියවීම | 1,015.47 |
| 69 | 990 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 ජූලි අලව්ව දුම්රියපොල ගේට්ටුව අසල ජල සැපයුමේ ජල බිල්පත්පියවීම | 479.73 |
| 70 | 991 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූලි කිරිවානාපොල සායන මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් පියවීම | 294.90 |
| 71 | 992 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූලි කැප්පිටිවලාන උප කාර්යාලයේ විදුලි බිල්පත් පියවීම | 715.80 |
| 72 | 993 | ඩී.ජ්. සෙනවිරත්න මයා | එල්.එල්. 6946 ටිපර් රථයේ අළුත් වැඩියාව සඳහා අතින් දැරූ වියදම්ලබා ගැනීම | 1,400.00 |
| 73 | 994 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022 ජූලි සතිපොළ දීමනා | 19,800.00 |
| 74 | 995 | අයි.එම්.එස්.එච්. ඉලංකෝන් මිය | ගමන් වියදම් | 800.00 |
| 75 | 996 | නදීකා අක්මීමන මිය | ගමන් වියදම් | 400.00 |
| 76 | 997 | කේ.එම්. වසන්ත කුමාර මයා | ගමන් වියදම් | 400.00 |
| 77 | 998 | ඩබ්.එච්.කීර්තිසේන මයා | අතිකාල දීමනා - 2022 ජූලි | 10,345.00 |

| | | | | |
|---|---|---|---|---|
| 78 | 999 | ආර්.පී.ඩී. අමරසිංහ මයා | අතිකාල දීමනා - 2022 ජූනි | 9,633.00 |
| 79 | 1000 | ආර්.පී.ඩී. අමරසිංහ මයා | අතිකාල දීමනා - 2022 ජූලි | 9,192.00 |
| 80 | 1001 | ඩී.ඒ. ජගත් පුෂ්ප කුමාර මයා | අතිකාල දීමනා - 2022 ජූලි | 8,787.00 |
| 81 | 1002 | උදය කුමාර සේනාරත්න මයා | අතිකාල දීමනා - 2022 ජූලි | 6,562.00 |
| 82 | 1003 | ටී.කේ. සුමේධ බණ්ඩා මයා | අතිකාල දීමනා - 2022 ජූනි | 6,499.00 |
| 83 | 1004 | ටී.කේ. සුමේධ බණ්ඩා මයා | අතිකාල දීමනා - 2022 ජූලි | 5,091.00 |
| 84 | 1007 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම - 2022.07.28 Z.A.5067 , R.D.1601, S.B.8367, PC 0366, LL-7772, 52-8668 | 132,440.00 |
| 85 | 1008 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම - 2022.08.03 PC- 0366 , R.B.-3571, R.D.-7740 | 55,470.00 |
| 86 | 1009 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම - 2022.08.04 S.B.8367 | 3,870.00 |
| 87 | 1010 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම - 2022.08.08 R.D.1601 (එන්ජින් ඔයිල් ලීටර් 2) | 2,200.00 |
| 88 | 1011 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | තණකොල කපන මැෂිම සඳහා පෙට්‍රල් සහ 2ටී මිලදී ගැනීම. | 2,425.00 |
| 89 | 1012 | එච්.එම්.සී.එම්. හේරත් මයා | වැටුප් සැකසීමට භාවිතා කරන ප්‍රින්ටරය අලුත්වැඩියාව | 8,500.00 |
| 90 | 1013 | කැලුම් මෝටර්ස් | S.B.8367 ට්‍රැක්ටරයඅලුත්වැඩියාව | 3,950.00 |
| 91 | 1014 | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | 2021 ඔක්තෝම්බර් ,නොවැම්බර්, දෙසැම්බර් මාස සඳහා පළාත් පාලනවිශ්‍රාම වැටුප් හිග හා දායක මුදල් ගෙවීම | 638,424.69 |
| 92 | 1015 | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | 2022 ජනවාරි, පෙබරවාරි, මාර්තු මාස සඳහා පළාත් පාලන විශ්‍රාමවැටුප් හිග හා දායක මුදල් ගෙවීම | 638,424.69 |
| 93 | 1016 | ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | ආර්.එම්.එන්.බී. රත්නායක මයාගේ දුම්රිය අනුග්‍රහ ප්‍රවේශ පත්‍රයසඳහා රජයේ දායක මුදල් ගෙවීම (මාස 03කට) | 3,600.00 |
| 94 | 1017 | ද ඇසෝසියේටඩ් නිවුස් පේපරස් ඔෆ් සිලෝන් ලිමිටඩ් | අලව්ව ප්‍රාදේශීය සභාව සතු භාවිතයෙන් ඉවත් කල වාහනයේ ප්‍රසම්පාදනදැන්වීම භාෂා ත්‍රිත්වයෙන් එල කිරීමේ ගාස්තු | 24,218.88 |
| 95 | 1018 | පේපර් කෝනර් | ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | 17,550.00 |
| 96 | 1019 | පියසේන විජේසූරිය මයා | 2022 ජූනි බෝයවලාන පුස්තකාලයේ පුවත්පත් බිල් පියවීම | 9,640.00 |
| 97 | 1020 | ටී.ඒ.ඩී.එස්. ප්‍රියදර්ශන මයා | 2022 ජූලි පුහුණු දීමනා | 8,000.00 |
| 98 | 1021 | ආර්.එම්.එන්.බී. රත්නායක මයා | ගමන් වියදම් | 740.00 |
| 99 | 1022 | උපාලි තිලකරත්න මයා | ගමන් වියදම් | 700.00 |
| 100 | 1023 | සුනිල් ප්‍රේමරත්න මයා | අතිකාල දීමනා - 2022 ජූලි | 6,889.00 |

| | | | | |
|---|---|---|---|---|
| 101 | 1024 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022 අගෝස්තු (ස්ථිර) වැටුප් ගෙවීම | 5,726,944.61 |
| 102 | 1025 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 2022 ජූලි මහරච්චිමුල්ල උප කාර්යාලයේ දුරකථන බිල්පත් පියවීම | 1,248.61 |
| 103 | 1026 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 2022 ජූලි අන්තර්ජාල පහසුකම් සහිත දුරකථනයේ බිල්පත් පියවීම | 4,535.89 |
| 104 | 1027 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 2022 ජූලි අලව්ව ප්‍රධානකාර්යාලයේ දුරකථන බිල්පත් පියවීම | 1,656.11 |
| 105 | 1028 | සී/ස ලංකා බෙල් සමාගම | 2022 ජූලි කැප්පිටිවලාන උප කාර්යාලයේ දුරකථන බිල්පත් පියවීම | 567.42 |
| 106 | 1029 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | අලව්වසතිපොළ හාවැසිකිලියහිග ජල බිල්පත් පියවීම (තැන්පත් මුදලින් ගෙවා ඇත) | 7,000.00 |
| 107 | 1030 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 අගෝස්තු ප්‍රධාන කාර්යාලයේ විදුලි බිල්පත් පියවීම | 10,134.05 |
| 108 | 1031 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූලි මහරච්චිමුල්ල උප කාර්යාලයේ විදුලි බිල්පත් පියවීම | 679.20 |
| 109 | 1032 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 අලව්ව ප්‍රජා ශාලාවේ විදුලි බිල්පත් පියවීම | 1,264.80 |
| 110 | 1033 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 අගොස්තු බෝයවලාන පුස්තකාලයේ විදුලි බිල්පත් පියවීම | 2,765.40 |
| 111 | 1034 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූලි වැලිකරේ සායනමධ්‍යස්ථානයේ විදුලි බිල්පත් පියවීම | 608.10 |
| 112 | 1035 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 අගෝස්තු කැප්පිටිවලාන උප කාර්යාලයේ විදුලි බිල්පත් පියවීම | 752.40 |
| 113 | 1036 | දිසානායක එන්ටර්ප්‍රයිසස් | S.B.8367 අත් ට්‍රැක්ටරයසඳහා ඉන්ධන -2022.08.19 | 4,300.00 |
| 114 | 1037 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම- pc -0366 - 2022.08.10, 52-8668 - 2022.08.15, RD-1601 -2022.08.16 | 53,320.00 |
| 115 | 1038 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම- RD-1601 , RD-9440, LE-7413 - 2022.08.10 SB-8367, ZA-5067 - 2022.08.12 | 86,860.00 |
| 116 | 1039 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම - RD-9440, LM-5623 -2022.08.17 | 83,850.00 |
| 117 | 1040 | සමන්ස්ඉංජිනියරින්සර්විසස් | ZA-5067 බැකෝ ලෝඩරය සේවා කිරීම | 11,770.00 |
| 118 | 1041 | සමන්ස්ඉංජිනියරින්සර්විසස් | SB- 8367 අත් ට්‍රැක්ටරය සේවා කිරීම | 13,620.00 |
| 119 | 1042 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022.08.30 පැවැත්වීමට නියමිත නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු සඳහාඅත්තිකාරම් | 3,750.00 |
| 120 | 1043 | සී.පි. පියසුමන මිය | RB-3571 ට්‍රැක්ටරයේ ආදායම් බලපත්‍රය යාවත්කාලීන කිරීම සඳහා අතින්දැරූ වියදම් | 1,100.00 |

| | | | | |
|---|---|---|---|---|
| 121 | 1044 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් | RW- 8668 ටේලරයේ රක්ෂණ බලපත්‍රය යාවත්කාලීන කිරීම | 3,066.22 |
| 122 | 1045 | පී.එල්. චන්ද්‍රතිලක මයා | පානීය ජලය සඳහා ගෙවීම | 5,300.00 |
| 123 | 1046 | ආසිරි පොත්හල -අලව්ව | ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | 4,920.00 |
| 124 | 1047 | ඕ.ඒ. සිරිල් ගාමිණී මයා | විදුලි උපකරණ මිලදී ගැනීම | 8,795.00 |
| 125 | 1048 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 අගොස්තු අලව්ව තාවකාලික සතිපොල විදුලි බිල්පත් පියවීම | 7,940.45 |
| 126 | 1049 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 අගොස්තු ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේවිදුලි බිල්පත් පියවීම | 2,319.60 |
| 127 | 1050 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 අගොස්තු අලව්ව පොදු වෙළඳ සංකීර්ණයේ විවෘත ආලින්ද 2 විදුලිබිල්පත් පියවීම | 1,704.00 |
| 128 | 1051 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 අගොස්තු අලව්ව පොදු වෙළඳ සංකීර්ණයේ විවෘත ආලින්ද 1 විදුලිබිල්පත් පියවීම | 3,479.10 |
| 129 | 1052 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 අගොස්තු අලව්ව බස් නැවතුම්පොළ සහ පොදු වෙළඳ සංකීර්ණයේ ජලබිල්පත් පියවීම | 2,015.63 |
| 130 | 1053 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 අගොස්තු අලව්ව බස් නැවතුම්පොළ අසල ජල සැපයුමේ ජලබිල්පත් පියවීම | 490.93 |
| 131 | 1054 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 අගොස්තු අලව්ව තාවකාලික සතිපොලජලබිල්පත් පියවීම | 8,282.50 |
| 132 | 1056 | පොස්ට් මාස්ටර් ජනරාල් | 2022 ජූනි/ජූලි මාස සඳහා නිදහස් තැපැල් පහසුකම් සඳහා ගෙවීම | 11,138.00 |
| 133 | 1057 | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | 2022 අප්‍රේල, මැයි, ජූනි මාස සඳහා පළාත් පාලන විශ්‍රාම වැටුප්දායකය හා හිග මුදල් ගෙවීම | 638,402.17 |
| 134 | 1058 | මධුර ප්‍රියංකර රත්නායක මයා | අලව්ව නගරය සංවර්ධනය කිරීමට අදාලව නගරයේ ගස් කැපීමේ යන්ත්‍ර කුලියගෙවීම | 3,500.00 |
| 135 | 1059 | රශ්මික මෝටර්ස් | එම්.කේ. 1794 යතුරු පැදියසේවා කිරීම | 4,200.00 |
| 136 | 1060 | ධම්මික හාඩ්වෙයාර් | ජලනල උපාංග මිලදී ගැනීම | 520.00 |
| 137 | 1061 | ගාමිණී වික්‍රමරත්න මයා | ගමන් වියදම් | 700.00 |
| 138 | 1062 | ඩී.ඒ.සෙනවිරත්න මයා | ගමන් වියදම් | 700.00 |
| **කර්මාන්ත ගිණුම** | | | | |
| 139 | 52 | පැරකුම් ගොවි සංවිධානය - පහළ කළල්පිටිය | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ නුගවෙල රුක්ගොල්ලේගෙදරසිට ඉහල කළල්පිටිය පාසල දක්වා මාර්ගය - බොරළු ඇතිරීම 10% රුඳවුම් ගෙවීම | 19,870.58 |

| | | | | |
|---|---|---|---|---|
| 140 | 53 | අලව්ව දකුණ එක්සත් ගොවි සංවිධානය | 2020 සභා අරමුදල් යටතේ අලව්ව බස් නැවතුම්පොළ පැති බැම්ම ඉදි කිරීම - 10% රැඳවුම් ගෙවීම | 6,672.47 |
| 141 | 54 | අලව්ව දකුණ එක්සත් ගොවි සංවිධානය | 2020 සභා අරමුදල් යටතේ අලව්ව මහජන ක්‍රීඩාංගනයේ දැල් වැට ගැසීම සහඇවිදින මං තීරුව ඉදි කිරීම - 10% රැඳවුම් ගෙවීම | 40,902.92 |
| 142 | 55 | අලව්ව දකුණ එක්සත් ගොවි සංවිධානය | 2020 සභා අරමුදල් යටතේ අලව්ව මහජන ක්‍රීඩාංගනයේ පැති බැම්ම ඉදිකිරීම 2 අදියර - 10% රැඳවුම් ගෙවීම | 120,489.99 |
| 143 | 56 | අලව්ව උතුර අරුණළු ග්‍රාම සංවර්ධන සමිතිය | 2020 සභා අරමුදල් යටතේ අලව්ව බස් නැවතුම් පොළ කඩ හිමියන්ගේවැසිකිලි පද්ධතිය ඉදි කිරීම - 10% රැඳවුම් ගෙවීම | 77,913.29 |
| 144 | 57 | අලව්ව උතුර අරුණළු ග්‍රාම සංවර්ධන සමිතිය | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ දුම්රියපොළ අතුරුමාර්ගයේ කුට්ටිගල් ඇතිරීම - 10% රැඳවුම් ගෙවීම | 19,045.96 |
| 145 | 58 | අලව්ව උතුර අරුණළු ග්‍රාම සංවර්ධන සමිතිය | 2020 සභා අරමුදල් යටතේ අලව්ව මහජන ක්‍රීඩාංගනය පැති බැම්ම ඉදිකිරීම 1 අදියර - 10% රැඳවුම් ගෙවීම | 88,233.85 |
| 146 | 59 | ගැමුණු ග්‍රාම සංවර්ධන සමිතිය - විල්ගමුවවත්ත | 2020 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ විල්ගමුවවත්ත සමිතිශාලාවේ ඉතිරි වැඩ නිම කිරීම - 1 අදියර ,10% රැඳවුම් ගෙවීම | 10,000.00 |
| 147 | 60 | ගැමුණු ග්‍රාම සංවර්ධන සමිතිය - විල්ගමුවවත්ත | 2020 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ විල්ගමුවවත්ත සමිතිශාලාවේ ඉතිරි වැඩ නිම කිරීම - 2 අදියර ,10% රැඳවුම් ගෙවීම | 6,450.00 |
| 148 | 61 | සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය - පල්ලේ කැකුලාවල | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ පල්ලේ කැකුලාවල සිරිල්සමරවීර මයාගේ නිවසට යන මාර්ගයේ කන්ද පාමුල සිට ඉදිරියට කොන්ක්‍රීට් කිරීම. 10% රැඳවුම් ගෙවීම | 19,935.14 |
| 149 | 62 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමුපකාර සමිතිය | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ අලව්ව බණ්ඩාරනායන මාවතප්‍රතිසංස්කරණයකිරීම. 10% රැඳවුම් ගෙවීම | 9,910.04 |
| 150 | 63 | අලව්ව උතුර අරුණළු ග්‍රාම සංවර්ධන සමිතිය | 2020 සභා අරමුදල් යටතේ අලව්ව මහජන ක්‍රීඩාංගනයේ ඇවිදින මංතීරු ඉදිකිරීම 1 අදියර- 10% රැඳවුම් ගෙවීම (10% රැඳවුමේ නොකල වැඩ සඳහා රු 33199.20 කමුදලක් අඩු කර ඇත) | 54,902.20 |
| 151 | 64 | සමගි ග්‍රාම සංවර්ධන සමිතිය ආණ්ඩුවවත්ත | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ආණ්ඩුවවත්ත සරත් මයාගේනිවස අසල කොන්ක්‍රීට් කිරීම - 10% රැඳවුම් ගෙවීම | 9,914.16 |
| 152 | 65 | අලව්ව දකුණ එක්සත් ගොවි සංවිධානය | 2021 සභා අරමුදල් යටතේ අලව්ව දුම්රිය පොළ මාර්ගය සංවර්ධනය කිරීම - 10% රැඳවුම් ගෙවීම | 74,115.27 |
| 153 | 66 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමුපකාර සමිතිය | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ගල්පොත්තේපොළ කැබැල්විටසිට බමුණුකොටුව දක්වා මාර්ගය සංවර්ධනය කිරීම - 10% රැඳවුම් ගෙවීම | 39,876.04 |

| | | | | |
|---|---|---|---|---|
| 154 | 67 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ කිරිමැටියසිට ඉඹුල්ගොඩදක්වා මාර්ගය අවශ්‍ය තැන්වලට බොරළු යෙදීම - 10% රැඳවුම් ගෙවීම | 19,993.41 |
| 155 | 68 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ වැලිහිද සමීරා හෝටලයඅසලසිට සමරක්කොඩිවත්තමාර්ගය කුට්ටිගල් ඇතිරීම - 10% රැඳවුම් ගෙවීම | 19,706.67 |
| 156 | 69 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ඉඹුල්ගොඩ ඇල්ලහේන වත්තඅසල සිට වෙල මැදමාර්ගය අවශ්‍ය තැන් වලටබොරළු යෙදීම - 10% රැඳවුම් ගෙවීම | 19,944.65 |
| 157 | 70 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ වැලිහිද සිටහෙණ්ඩුවාවත්ත හරහා යන පරගහමුලවත්ත මාර්ගය අවශ්‍ය ස්ථාන කොන්ක්‍රීට් කිරීම - 10% රැඳවුම් ගෙවීම | 19,992.31 |
| 158 | 71 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | 2021 සභා අරමුදල් යටතේ පරගහකොටුවවත්ත මාර්ගය සංවර්ධනය කිරීම - 10% රැඳවුම් ගෙවීම | 49,914.93 |
| 159 | 72 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | 2022 සභා අරමුදල් යටතේ හෙණ්ඩුවාවත්ත සුසාන භූමිය වටා වැට සැකසීම -අවසන් ගෙවීම | 132,993.59 |
| 160 | 73 | පැරකුම් ගොවි සංවිධානය - පහළ කළල්පිටිය | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ පාතයාල පොදු ලිඳඅළුත්වැඩියා කිරීම-10% රැඳවුම් ගෙවීම | 16,774.66 |
| 161 | 74 | ග්‍රාම සංවර්ධන සමිතිය - විල්ගමුව | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ විල්ගමුව ශ්‍රී ධර්මරාජඅවමංගල්‍යාධාර සමිතියේ බඩු ගබඩා රාක්ක සැකසීම - අවසන් ගෙවීම. | 85,547.45 |
| 162 | 75 | ගැමුණු වැඩිහිටි සංවිධානය - කැබැල්විට | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ පඹදෙණිය ඉස්වැටියහන්දියේ සිට අමුණෝවිටවත්ත හරහා කැබැල්ලවිටමාර්ගයේ වෙල් යාය අසල සිට කොන්ක්‍රීට්කිරීම - අවසන් ගෙවීම | 177,548.45 |
| 163 | 76 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ඉහළ වළකුඹුර ප්‍රධාන ඇලනියර මාර්ගය පස් දමා සංවර්ධනය කිරීම 10% රැඳවුම් ගෙවීම. | 9,984.71 |
| 164 | 77 | සමගි ග්‍රාම සංවර්ධන සමිතිය ආණ්ඩුවවත්ත | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ආණ්ඩුවත්ත පොදු නාන ලිදමාර්ගයේ අවශ්‍ය ස්ථාන කුට්ටි ගල් ඇල්ලීම. 10% රැඳවුම් ගෙවීම. | 14,575.19 |

| | | | | |
|---|---|---|---|---|
| 165 | 78 | ශක්ති වැඩිහිටි සංවිධානය - නැබඩවතුර | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ නැබඩවතුර පහලගමපැපොල්ගස් ඉන්න මාර්ගය බේක් වත්ත කදු කොටස ඉතිරි කොටස් කොන්ක්‍රීට් කිරීම.10% රූදවුම් ගෙවීම. | 9,920.89 |
| 166 | 79 | ශක්ති වැඩිහිටි සංවිධානය - නැබඩවතුර | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ බෝගමුව -හිරිකුඹුර හරහා ඕතර කිරුවම්පොල මඩවල මාර්ගයහිරිකුඹුර වෙළඳ සීමාවේ පයිප්ප බෝක්කුව ඉදි කිරීම.10% රූදවුම් ගෙවීම. | 9,739.21 |
| 167 | 80 | එක්සත් වැඩිහිටි සංවිධානය - පංගොල්ල | 2022 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ගල්ගමුව අංක 8 අභ්‍යන්තර මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම. 10% රූදවුම් ගෙවීම. | 9,944.81 |
| 168 | 81 | එක්සත් වැඩිහිටි සංවිධානය - පංගොල්ල | 2022 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ වැලිකරේ ළහිරු මයාගේනිවස ඉදිරිපිට සිට ගල්ගමුව ක්‍රීඩා පිටිය දෙසට මාර්ගය බොරළු දමා සංවර්ධනයකිරීම. 10% රූදවුම් ගෙවීම. | 9,984.04 |
| 169 | 82 | එක්සත් වැඩිහිටි සංවිධානය - පංගොල්ල | 2022 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ගල්ඔලියාව අයිරා මියගේකඩය අසල සිට වැලිකරේ දක්වා මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම. 10% රූදවුම් ගෙවීම. | 9,980.12 |
| 170 | 83 | අග්‍ර බෝධි වැඩිහිටි සංවිධානය - අග්බෝව | 2021 ග්‍රාමීය මාර්ග සංවර්ධනය යටතේ අග්බෝව කිරිමැටිය මාර්ගයේවිහාරස්ථානය අසල සිට ඉදිරියට මාර්ගය සංවර්ධනය කිරීම. 10% රූදවුම් ගෙවීම. | 839,984.81 |
| 171 | 84 | මහසෙන් ග්‍රාම සංවර්ධන සමිතිය - දෙහෙල්ගමුව | 2021 ග්‍රාමීය මාර්ග සංවර්ධනය යටතේ බුළුවමාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 442,460.71 |
| 172 | 85 | සමගි ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය - ඕතර කිරුවම්පොල | 2021 ග්‍රාමීය මාර්ග සංවර්ධනය යටතේ ඕතර කිරුවම්පොල සමිති ශාලාවඅසලින් යන හල්මිල්ලගොල්ල මාර්ගය සංවර්ධනය කිරීම | 282,916.36 |
| 173 | 86 | සමගි ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය - ඕතර කිරුවම්පොල | 2021 ග්‍රාමීය මාර්ග සංවර්ධනය යටතේ ඕතර කිරුවම්පොල වීරමුල්ල දේවාලයඅසලින් හල්මිල්ලගොල්ල මාර්ගයමුල් කොටසසංවර්ධනය කිරීම | 433,216.67 |
| 174 | 87 | පංගොල්ල එක්සත් වැඩිහිටි සංවිධානය | 2022 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ තැම්පිටිගොඩ සිට නල්ලූරදක්වා මාර්ගයබොරළු දැමීම.10% රූදවුම්ගෙවීම | 9,984.04 |
| 175 | 88 | පංගොල්ල එක්සත් වැඩිහිටි සංවිධානය | 2022 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ තැම්පිටිගොඩ සිටනල්ලූර් අභ්‍යන්තර මාර්ගය බොරළු දැමීම.10% රූදවුම් ගෙවීම | 9,944.81 |
| 176 | 89 | පැරකුම් ගොවි සංවිධානය - කැප්පිටිවලාන | 2022 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ වැලිහිද පරගහමුල වත්තමාර්ගය කොන්ක්‍රීට් කිරීම.10% රූදවුම් ගෙවීම | 9,919.40 |

| | | | | |
|---|---|---|---|---|
| 177 | 90 | අලව්ව උතුර අරුණළු ග්‍රාම සංවර්ධන සමිතිය | 2021 සභා අරමුදල්යටතේඅලව්ව පුස්තකාලය ප්‍රතිසංස්කරණය කිරීම.අවසන් ගෙවීම | 806,875.54 |
| 178 | 91 | මහසෙන් ගොවි සංවිධානය - බෝවල , නවතල්වත්ත | 2022 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ බෝවල සුසාන භූමියඅසලින් මාග්‍රට් මියගේ නිවස ඉදිරිපිට මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම.10% රැඳවුම් ගෙවීම | 29,940.96 |
| **සේවක ණය ගිණුම්** | | | | |
| 179 | 22 | එන්.එම්.අයි.ඩී. ප්‍රියශාන්ති මිය | ආපදා ණය ගෙවීම | 70,822.00 |
| **180** | 23 | ජේ.එම්. සරත් ජයමහ මයා | ආපදා ණය ගෙවීම | 108316.00 |
| 181 | 24 | ඩී.ආර්.ටී.එම්. දසනායක මිය | ආපදා ණය ගෙවීම | 62490.00 |
| **182** | 25 | අයි.එම්.එස්.එච්. ඉලංකෝන් මිය | ආපදා ණය ගෙවීම | 91511.00 |
| 183 | 26 | ජේ.එම්.ඩී.ඩී. ජයකඩුමිය | ආපදා ණය ගෙවීම | 87486.00 |
| **184** | 27 | ආර්.එම්.කේ. රත්නායකමිය | ආපදා ණය ගෙවීම | 70822.00 |
| 185 | 28 | ටී.ඩී. නදීෂා ජයමාලි මිය | ආපදා ණය ගෙවීම | 250,000.00 |
| **186** | 29 | ඊ.ඒ.එස්.එන්.කරුණානායක මිය | ආපදා ණය ගෙවීම | 41660.00 |
| 187 | 30 | ආර්.ඒ. අජන්තා රණසිංහ මිය | ආපදා ණය ගෙවීම | 74988.00 |
| | | | ආපදා ණයමුදල් යැවීම - ලේකම් නාරම්මල ප්‍රාදේශීයසභාව | 175,012.00 |
| | | | මුළු එකතුව | **17,547,954.03** |

**<u>2022.08.01 දින සිට 2021.08.31 දක්වා ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරීම.</u>**

අනු අංක 170 හා වවුචර් අංක 83 යටතේ **" 2021 - ග්‍රාමීය මාර්ග සංවර්ධනය යටතේ අග්බෝව කිරිමැටිය මාර්ගයේ විහාරස්ථානය අසල සිට ඉදිරියට මාර්ගය සංවර්ධනය කිරීම - 10% ක රැඳවුම් ගෙවීම "** යන විස්තරය **" 2021 - ග්‍රාමීය මාර්ග සංවර්ධනය යටතේ අග්බෝව කිරිමැටිය මාර්ගයේ විහාරස්ථානය අසල සිට ඉදිරියට මාර්ගය සංවර්ධනය කිරීම "**ලෙස සංශෝධනය විය යුතුය

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022/08/01 දින සිට 2022/08/31 දින දක්වා ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාව ඉහත සංශෝධන වලට යටත්ව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022/08/01 දින සිට 2022/08/31 දින දක්වා ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාව ඉහත සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

**<u>10. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම</u>**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙය අලව්ව නගරයට බලපාන ප්‍රශ්නයක්. අතීතයේ ඉදලම අලව්ව - නෙළුන්දෙණිය මාර්ගයේ ධාවනය කරන බස් රථ අලව්ව දුම්රියපොලට එහා පැත්තේ තමයි නවත්වන්නේ. දැන් ඒ බස් නවත්වන්නෙ පාලමෙන් එහා පැත්තේ. අලව්ව නගරයට බඩු භාණ්ඩ ලබාගැනීමට එන අයට බස් රථයට යාම සඳහා ත්‍රීවිල් රථයකින් තමයි එහා පැත්තට යන්න වෙන්නේ. එයට ලොකු මුදලක් වැය වෙනවා.ඉස්සර පාලමෙන් මෙහා පැත්තෙ ප්‍රාදේශීය සභා භූමියේ තමයි බස් රථ නතර කලේ. මම ඉල්ලීමක් කරනවා අලව්ව ඩිපෝවේ ඩිපෝ අධිකාරීතුමත් සමඟ සාකච්ඡා කරල බස් රථ පරණ පාලම අසල පාලමෙන් මෙහා පැත්තෙ නතර කිරිමට අවස්ථාව සලසන්න කියල.

ඒ වගේම වෙළඳ සංකීරණයේ උඩු මහල සම්බන්ධයෙන් ප්‍රශ්ණයක් තිබෙනවා. ඩිපෝවේ බස්නැවතුම භාර පුද්ගලයා කීප අවස්ථාවකම කතා කරල කීවා උඩු මහලේ විවිධ ප්‍රශ්න ඇති වන බව. උඩු මහලෙ තවත් කඩකාමර කිහිපයක්ම වහල තිබෙන්නෙ. මේක සභාවේ ප්‍රශ්ණයක්, මේකට මැදිහත් වෙන්න, මේක ඔබතුමා නියෝජනය කරන නාගරික කොට්ඨාශය තුලයි තිබෙන්නෙ කියලා ප්‍රදේශයේ පාසල් වල ගුරු මණ්ඩලයේ කිහිප දෙනෙක්ම කතා කරල කීවා. මේ උඩුමහල තුලට ඇතුළු වුණාට පස්සෙ මේකෙ වටේම ඇවිදල එලියට බහින්න තිබුණා නම් මේ විදිහට යම්යම් අකටයුතුකම් සිදු වෙන්නෙ නෑ. අවසානයේදී මේකෙ ඇඟිල්ල දික්වෙන්නෙ ගරු මහජන මන්ත්‍රීවරුන්ට සහ සභාවේ ඉන්න නිලධාරීන්ට. මේ සම්බන්ධව අඟහු ලෙස අපේ නිලධාරින් යවලා ස්ථානීය පරික්ෂාවක් කරල මෙයට තීන්දුවක් ගන්න කියල ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
ඔබතුමාලට මතක ඇති කමිටු රැස්වීම්වලත් මම පැවසුවා එමෙන්ම සභා රැස්වීමෙත් මීට පෙර කියලා තිබෙනවා, ලේකම්තුමියත් මමත් මේ කඩ කාමර එක ගානෙ ගිහින් පරික්ෂා කලා. මෙහි බිත්ති දිගේ බුලත් කෙල ගහලා තිබෙනවා. වෙළඳ සංකිර්ණයට නිලධාරී කෙනෙකුත් දාල තිබෙනවා. අපි කඩිනමින් මේ පිළිබඳව තීරණයක් ගත යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, පසුගිය කාලේ අපේ ගම් ප්‍රදේශවල පොඩි පොඩි හොරකම් කිහිපයක් සිදු වුනා. ප්‍රදේශවාසීන් සමඟ මේ හොරකම් පිළිබඳව අපි විමසිලිමත්ව වැඩ පිළිවෙලක් සකස් කලා. මේකෙ ඉන්නෙ කුඩු පාවිච්චි කරන පිරිස්. අපි මේ පිළිබඳව පොලිසිය දැනුවත් කලා. නමුත් පොලිසිය පැත්තෙන් මේකට කිසිදු ක්‍රියාමාර්ගයක් ගත්තෙ නෑ. මේ පිළිබඳව කුරුණෑගල ජ්‍යෙෂ්ඨ පොලිස්අධිකාරිතුමා හරි දැනුවත් කරල මේකට ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන් නම් හොඳයි. ප්‍රදේශයේ ජන ජීවිතය යථාවත් කර ගන්න නම් මේ හොරුන්ට අනිවාර්යෙන්ම නීතියෙන් දඬුවම් කලයුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, පසුගිය සභා වාර්තාවෙ ඉතා වටිනා යෝජනා දෙකක් සම්මත වුණා. එම යෝජනා සභා වාර්තාවේ අදාල කොටසුත් සමඟ පාර්ලිමේන්තුව නියෝජනය කරන

පක්ෂවලටත්, අග්‍රාමාත්‍යතුමා ප්‍රධාන අමාත්‍ය මණ්ඩලයටත් යොමු කරන මෙන් ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිනවා.

ඒ වගේම නැබඩවතුර, ඕතර කිරුවම්පොල මාර්ගයේ බෝගමුව ගම්මානයට අයත් මාර්ගය අපේ ප්‍රතිපාදනවලින් වගේම නොයෙක් ආකාරයෙන් සංවර්ධනය කලා. මෙම මාර්ගයේ වෙල්යාය කොටස ගමන් කල නොහැකි තත්වයට පත්වෙලා තිබෙනවා. අපි සැලසුම් කලා අපේ රුපියල් ලක්ෂ තුනක ප්‍රතිපාදනත්, ග්‍රාම සංවර්ධන සමිතියේ ගිණුමෙන් රු. ලක්ෂ පහක මුදලකුත් අරගෙන තාර දමා අවසන් කරමු කියලා. නමුත් අද භාණ්ඩවල මිලගණන් බැලුවම ඒ ගැන හිතන්නවත් විදිහක් නැහැ. විශේෂයෙන්ම එහි නිවසක පිංකමක් පැවැත්වෙන බැවින් ප්‍රධාන වලවල් ටික හරි වහල දෙන්න කියල ඉල්ලීම් කලා.නමුත් සභාවේ ප්‍රතිපාදන වෙන් කරල තිබුණත් මුදල් නොමැති නිසා එතුමා මතක් කලා. රු.25000.00 ක් විතර වියදම් කරල වැලි සෝදන ස්ථානයකින් සෝදපු ගල් ගෙනවිත් පාරට දාලා සකස් කලා කියලා. ඒ වගේම මම දායක සභාවට සහභාගි වුණාම මගේ අවධානයට යොමු කලා කයීන පිංකම තිබෙන මේ පාර එම කොටස යථා තත්වයට පත් කරන්න කියලා. ඒ නිසා මගේ ප්‍රතිපාදන කොටසින් ඉතුරු වලවල් ටික වැලි හෝදපු ගල් දමා සකස් කර ගන්න යෝජනාව සම්මත කරල තිබෙන්නේ. ඒ පිළිබඳව ඔබතුමියගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

එමෙන්ම බෝයවලාන නගරයේ බෝතල්, ප්ලාස්ටික් බඩු එකතු කරන කූඩුවකුත් ස්ථාපිත කරල දෙනව නම් වඩාත් හොඳයි. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියල ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අප ප්‍රදේශයේ හොරකම් රාශියක් තිබෙනවා. එය හරිම කණගාටුදායක සිද්ධියක් කුඩු ව්‍යාපාරය තමයි මේක ඇතුලෙ තිබෙන්නේ. අගමැති කාර්යාලයේ සම්බන්ධකම් තියෙන පුද්ගලයෙක්අප ප්‍රදේශයේ සිටිනවා . මේ පුද්ගලය මේවාට පොලිසියට කතා කරනවා. මේ දේවල් වෙනකොට ගමේ ඉන්න හොරු තවත් වැඩි වෙනවා. පොලිසියට ගියාම මේවාට විසඳුම් ලැබෙන්නේ නෑ. මේ සම්බන්ධයෙන්ලිපියක් මගින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලය දැනුවත් කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මම ඉඹුල්ගොඩ ගැමුණු අවමංගල්‍යාධර සමිතියේ සභාපතිවරයා. මේ සමිතියේ භාණ්ඩ භාරව සිටින පුද්ගලයාගේ නිවසේත් පුටු 12 ක් සොරකම් කරල තිබෙනවා. මේ පිළිබඳව පොලිසියේ පැමිණිල්ලක් දැම්මට පස්සෙ හොරා ගමෙන් ගිහිල්ලා. මාස ගාණකට පසු ඒ පුද්ගලය ගමට ඇවිත් සිටිනවා. මේ පිළිබඳ පොලිසියට කතා කලා. නමුත් වැඩක් වුනේ නෑ. පසුව කුරුණෑගලට කතා කලත් එයිනුත් ඵලක් වුනේ නෑ.

ඒ වගේම ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය පිටුපස වැසිකිලියක් ඉදි කරනවා නම් හොඳයි. එමෙන්ම ක්‍රීඩාගාරයේ දොරවල් යකඩ ෆ්‍රේම් ගහල හරි ආරක්ෂා කරනවා නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ගරු ශාන්ත බණ්ඩාර මැතිතුමාත්, ගරු සුමිත් රාජපක්ෂ මැතිතුමාත් එකතුවෙලා අලව්ව නගරය සංවර්ධනය කිරිමට යම් වැඩ කොටසක් කලා. ඒ කාලයේ ගරු සභාපති ධූරයේ කටයුතු කලේ ධර්මරත්න හේරත් මැතිතුමා. දැන් ඔබතුමිය ඉන්නවා. නමුත් ආණ්ඩුවට යම් යම් ප්‍රශ්ණ ඇති වුනා. මම දැක්කා තව එක කඩයක් කඩන්න ඉතුරුවෙලා තිනෙවා. අනිත් ඒව ඔක්කොම කඩලයි තිබෙන්නේ. සියළු දෙනාම එකතුවෙලා නගරය කඩා ගත්ත එක ඒ වෙලාවෙ ලොකු පහසුවක් වුනා. මේකට මුලින්ම ආදර්ශය දුන්නෙ විපක්ෂනායකතුමා. මේ වෙලාවේ අපි එකතුවෙලා නගරයේ යම් දැනුවත් කිරිමක් කරනවා නම් හොඳයි. නැත්නම් ආයෙත් කඩවල් ඉදිරිපිට විවිධ තාවකාලික ඉදිකිරීම් කරන්න පුළුවන්. ඒ නිසා අපි ඒ කල දේ රැකගනිමු කියල මම අවධානය යොමු කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

එතුමා කියූ විදිහට ඒ අවස්ථාවේ සියළු දෙනාම එකතු වෙලා ඒ කටයුතු කලා. ඒ වෙලාවෙ නගර සංවර්ධන අධිකාරිය හරහා යම් සංවර්ධනයක් සිදුවීගෙන ආවා. ඒ අතරතුරයි මම සභාපති ධූරයට පත් වුනේ. මම සභාපති ධූරයට පත්වුනාට පසුව මම කියන ඒව විතරක් නෙවෙයි, මම දකින වැරදි අඩුපාඩු චෝදනා සියල්ලම නාගරික සංවර්ධන අධිකාරියත් එක්ක සම්බන්ධ වෙලා ඒවා ගැන සොයා බැලුවා. ලබා දියහැකි සහයෝගය මම ලබා දුන්නා. මගේ සහෝදරයාගේ ඉඩම ලඟින් මේ මැනිම් කටයුතු සිදුකරන විට පාර මැද සිට දෙපසට මැනුම් කිරිම වෙනස් වෙලා තිබුණා. නමුත් අපි ඒ ගැනත් සානුකම්පිතව බලලා එය ලබාදුන්නත් ඉන්පසු විදුලිබල මණ්ඩලයත් සමඟ කතා කල විට ඒ අය විදුලි කණු සිටුවීම, විදුලි මීටර් සවිකිරිම ආදියට ගෙවීම් කරල තිබුණා. සභාවෙන් මේ සඳහා ගෙවීම් කරන්න කියල අපිට ලිපි ලැබිල තිබුණා. ඒ පිළිබඳව සොයා බැලුවමයි දැනගන්න ලැබුනේ විදුලි බල මණ්ඩලයෙන් ඒවා ගෙවීම් කරල තිබෙන්නේ කියලා. ඒවා දැන් කෙරිල තිබෙනවා. නමුත් කණු හතරක් පලවෙනි ටෙන්ඩර් එකට ඇවිල්ල නෑ. දෙවන ටෙන්ඩර් එකේ තමයි ඒ කොටස තිබෙන්නෙ. රටේ යම් ස්ථාවර බවත් ඇතිවුණාම ඒ ටික සිදු කරාවි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ව්‍යාපාරික ස්ථාන සඳහා අඩි 40 ක සීමාව අතහැරල ඉදිකිරීම් කරන්න අපි අනුමැතිය දීල තිබුණා. මැතකදී එම අඩි 40 සිමාව තුල එක් ස්ථානයක තට්ටු 4ක ගොඩනැගිල්ලකට සැලසුම් කරනවා. මේ සම්බන්ධවත් විධිමත්ව සොයා බැලිමක් සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

ඉදිකිරිම් කරන හැමෝටම නගර සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගෙන අදාල කොන්දේසි ලබා දීල තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය**

ගරු සභාපතිතුමියනි, දැනට මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ අයව ගලවා ගැනිමට හැකියාවක් නෑ. ඒ අය පුනරුත්ථාපන කඳවුරු වලට යොමු කරලයි එයින් මුදවා ගැනිමට සිදුවන්නේ. නමුත් මම බලාපොරොත්තු වන්නෙ පාසල් සිසුන් පිළිබඳ කතා කිරිමටයි. විවිධ මත්ද්‍රව්‍ය වර්ග වලට අද දරුවන් යොමු වෙමින් පවතිනවා. එය වලක්වා ගැනිමටයි මේ උත්සහායක් දරන්නේ. මම අලව්ව වෙල්කම් හන්ඩ්‍රඩ් සිංහ සමාජයත් සමඟ එකතු වෙලා 18 වෙනි ඉරිදා දින අලව්ව රාහුල පිරිවෙනේදී පෙ.ව 8.00 සිට 12.00 දක්වා දේශනයක් පැවැත්වීමට සුදානම් කරල තිබෙනවා. අපේ ගරු සභාපතිතුමිය ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලයට මතක් කිරීමක් කරන්න බලාපොරොත්තු වෙනවා අපේ ගම්වල සිටින මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙනවා කියලා සිතෙන අය මේ අවස්ථාවට යොමු කරන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, නැවත වතාවක් තේක්ක කන්ද කැපීමට දැනටමත් පාරවල් හැදීගෙන යනවා. එයඅපේ ගමට තර්ජනයක් වෙලා තිබෙන්නේ. මේ නිසා කන්දේ සිටින සත්තු ටික ගම් වැදිලා තිබෙනවා. මේ ප්‍රදේශයම දැන් වන සතුන්ගේ ග්‍රහනයට හසු වෙලයි තිබෙන්නේ. සතුන්ට ආහාරයට ගැනීමට කොස් වගේ දෙයක්වත් මේ ප්‍රදේශයේ රෝපණය කරනවා නම් හොඳයි. ඒ පිළිබඳවත් අවධානය යොමුකරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, තුන්දොල කන්ද පාලම අසල මාර්ගය මාස 05 ක පමණ සිට අබලන් වෙලයි තිබෙන්නේ. මාර්ග සංවර්ධන අධිකාරියට කතා කලාම මුදල් ප්‍රතිපාදන නොමැති බව කියනවා. ඒ සඳහා තාමත් විකල්පයක් නෑ. මගේ සභා ප්‍රතිපාදන වලින් හෝ යම් ප්‍රමාණයක් හා

JCB යන්ත්‍රය ලබා දෙන්නේ නම් තාවකාලිකව හෝ එම මාර්ගය සකස් කරගැනීමට අපට හැකියාවක් තිබෙනවා. මේ පිළිබඳ අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මන්ත්‍රීතුමියන්ලා දෙදෙනා හොඳ යෝජනා දෙකක් ඉදිරිපත් කලා. ඒ වගේම මේ මාර්ගය පිළිබඳව ජනතාව මටත් කතා කලා. එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහායි මෙහි රැඳවුම් මුදල් තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලිපියක් යොමු කල විට මාර්ග සංවර්ධන අධිකාරියට මුදල් නොමැති බවත් සභාවේ කාර්මික නිලධාරීන් යොදවා හෝ වාර්තාවක් ගන්න කියලාත් ප්‍රාදේශීය ලේකම්තුමිය දන්වා එවා තිබෙනවා. මාර්ග සංවර්ධන අධිකාරියට වගේම සභාවටත් මුදල් නෑ. මන්ත්‍රී ප්‍රතිපාදන ලැබුනෙත් නෑ. වෙන සභාපතිවරු ඉන්න කාලේ මන්ත්‍රී ප්‍රතිපාදන විතරක් නොවෙයි, සභා ප්‍රතිපාදන වලින් පවාපැති බැමි බැඳලා තිබෙනවා, කොන්ක්‍රීට් දමා තිබෙනවා. මම ඇවිල්ලා දැන් මාස 09 ක් පමණ වෙනවා. ඔබතුමාලාට ලැබෙන තරම් දෙයක්වත් තාම මට ලැබිලා නෑ. අද අපේ සභාවට මුදල් නෑ. ඒ වගේම වෙන ආයතනවලින් කල වැඩසටහනකට අපි සම්බන්ධ වුවහොත් අපි විගණනයට ලක් වෙනවා.

එමෙන්ම කාණු කැට ඉල්ලපු අයට කාර්මික නිලධාරී වාර්තාවට අනුව අපි ඒවා ලබා දීලා තිබෙනවා. තවත් ලිපි කිහිපයක් තිබෙනවා. ඒ කාර්මික නිලධාරී වාර්තාවේ පුද්ගලික ස්ථාන යනුවෙන් සඳහන් කල ලිපි. ඒවා මම සභාවට ඉදිරිපත් කරන්නම්. මේ ප්‍රතික්ෂේප වූ යෝජනා ගැන හිතලා ඔබතුමන්ලා තීරණයක් ගන්නවා නම් හොඳයි.

1. විමල් ජයරත්න මයා, හැඩිපන්නල, යටිගල්ඔළුව
2. ආර්.පී. අසේල සම්පත් මයා, පහළවත්ත, වෙන්නොරුව
3. ඩබ්.ඒ. තිලකරත්න මයා, විල්ගමුව, මහරච්චිමුල්ල
4. එස්.ඒ. රජිත සුබසිංහ මයා, ජයසිරි, කොස්සින්න, මහරච්චිමුල්ල
5. ඩබ්.ජේ.එච්. සාපින් නෝනා, පාසල් මාවත, කන්දේගෙදර, මහරච්චිමුල්ල

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ගල්පොත්තේපොල මරණ පරීක්ෂණ මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයටත් කාණු කැට ලබා දෙනවා නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මම යෝජනාවක් ඇතුලත් කරන්න කැමතියි. නිවාස 03 ක් වගේ තිබෙන තැන්වලට කාණු කැට ඉල්ලන අවස්ථාවල සභාවට යොමු කිරීමට අවශ්‍ය නෑ. එම ස්ථාන වලට කාණු කැට ලබා දීම සුදුසුයි කියලා මම යෝජනා කරන අතර ඉහත ස්ථාන සඳහාද කාණු කැට ලබා දීම සුදුසුයි කියලා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, රිටිගහදෙනිය කඳයාය දක්වා මාර්ගයේ දෙපස කැලේ කපලා දෙන්න. පොල්ගහවෙල මාර්ග සංවර්ධන ඉංජිනේරු කාර්යාලය හරහායිමෙය අපට කරන්න සිදුවෙන්නේ. එහි ඉංජිනේරුතුමාට දැන්වූ විට මාර්ග කම්කරු මහතුන් යොදවලා මාර්ගය පිළිසකර කර දෙයි. ඊට අමතරව මාර්ග සංවර්ධන අධිකාරියට ලිපියක් යොමුකර මේ කටයුත්ත කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරන ලෙස ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා.

එමෙන්ම බඹරගල කොට්ටවත්ත මාර්ගයේ ස්ථාන කීපයක් හා වීරවංශ මන්ත්‍රීතුමා ප්‍රකාශ කල තුන්දොල මාර්ගයේ එම ස්ථානයත් පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරියට දන්වලා මේ සම්බන්ධව යම් ක්‍රියා මාර්ගයක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

එමෙන්ම හඟවත්ත පිංකොටුව අසල ඇති බෝක්කුව කඩා වැටෙන්න ඇවිත් තිබෙනවා. ඒ සම්බන්ධවත් තාක්ෂණ නිලධාරීතුමා මගින් ස්ථාන පරික්ෂාවක් කර ක්‍රියාමාර්ගයක් ගන්න කියලා මතක් කරනවා.

එමෙන්ම බඹරගල අනුර මහතාගේ කුඹුර අසල බෝක්කුව කඩා වැටිලා තිබෙනවා. අඩුම තරමින් ගමන් කල හැකි ආකාරයට ගල් ටිකක් දාලා එම ස්ථානය පිළිසකර කලත් ඇති කියන එකයි මගේ හැඟීම.

එමෙන්ම ලෙව්දෙණිය වීරක්කොඩි මහතාගේ නිවස අසල කඳු බෑවුමේකොන්ක්‍රීට් ගල් ගැලවිලා ගමන් කල නොහැකි තත්වයට පත්වෙලා තිබෙනවා. එම ස්ථානයට පසුගිය රජයෙන් ගමකට දෙන ලක්ෂ 10 න් අපි හදන්න යනකොට කාපට් එක එම ස්ථානයට එන බව කී නිසා එම ස්ථානය අපි අයින් කලා. නමුත් ඒ දෙකම කෙරුනේ නෑ. එම ස්ථානයටත් කාර්මික නිලධාරීන් යොදවා ස්ථාන පරික්ෂාවක් කර යම් පියවරක් ගනිමු.

බඹරගල පන්සල අසලත් පරික්ෂා කරලා යම් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, රිටිගහදෙණිය කඳයාය මාර්ගය පිළිබඳව මම උප සභාපතිතුමාට මතක් කලේ දිවුල්ගහකොටුව බෞද්ධ මධ්‍යස්ථානයට ලබන මාසයේ 09 වෙනිදා මම දන්නා ආකාරයට ජනාධිපතිතුමා පැමිණෙනවා. ඒ නිසා පාර දෙපැත්තේ කැලෑව කපා ගන්න ඔබතුමිය හරහා පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් කලොත් හොඳයි. මොකද පළාත් සභාවටයි පාරේ අයිතිය තිබෙන්නේ. ඒ වගේම වීදි ලාම්පු ප්‍රශ්නයත් සෑම තැනම තිබෙන ප්‍රශ්නයක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සියළු මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලීමක් කරනවා සියළුම කමිටුවලට මන්ත්‍රීවරු සහභාගී වෙන්න කියලා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අපේ විදුලි බල්බ් ඉවර වෙලා තිබුණා. අපි කාලසටහනක් හදලා සෑම වසමකටම මන්ත්‍රීවරුන් දැනුවත් කරලා පිළිවෙලට යවලා තිබෙනවා. දැන් බල්බ් වලට ටෙන්ඩර් දාලයි තිබෙන්නේ. හැකි විගස නැවත ඒ කටයුතු ආරම්භ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, වීදි පහන් සම්බන්ධ ඔබතුමියගේ වැඩපිළිවෙල මම ඉතාම අගය කරනවා. විශේෂයෙන්ම අවධානය යොමු කරන්න කැමතියි, මගේ අත්දැකීම් අනුව වීදි පහන් කොපමණ යයිද කියන එක සම්බන්ධයෙන් සීමාවක් නෑ. මම හිතනවා ප්‍රදේශයේ තිබෙන අක්‍රිය වීදි පහන් පිළිබඳව සොයා බලලා ඔබතුමියට යොමු කලොත් නඩත්තු කටයුතු සිදු කරන්න පහසු වෙයි.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

එහෙම තමයි අපි කියලා තිබෙන්නේ. කලින් මන්ත්‍රීතුමාලට දැනුවත් කලා අක්‍රිය වීදි පහන් තිබෙන ස්ථාන පිළිබඳව හොයාගන්න කියලා. අපිට ඉන්ධන ප්‍රශ්නයකුත් තිබෙන නිසා එය පහසුවක් වේවි. ජයතිලක මන්ත්‍රීතුමා එතුමාගේ ප්‍රදේශයේ වීදි පහන් සවිකල ස්ථාන පිළිබඳ තොරතුරු, ඒ වගේම විදුලි පහන් නිවන්න, නඩත්තු කරන්න භාර දුන් පුද්ගලයාගේ දුරකථන

අංක අපිට ලබා දෙනවා. එසේ ලබා දුන්නොත් කුමක් හෝ ගැටළුවක් ඇති වුවහොත් ඒ පුද්ගලයාට කතා කරලා දැනුවත් කරන්න අපිට පහසුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, වීථි පහන් අළුත්වැඩියා කරන සේවක මහතුන් විථි පහන් සවිකල ස්ථාන පිළිබඳ පැහැදිලිව සටහන් කරනවා. අවසානයේ සවිකල වීථි ලාම්පු ප්‍රමාණය කොපමණද කියලා අපෙන් අත්සන් කරගන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සමහර ස්ථානවල වීථි ලාම්පු පැය 24 ම ක්‍රියාත්මක වෙනවා. ඒ අවස්ථාවල ඔබතුමිය විදුලි කාර්මික මහතුන්ට බලය ලබා දෙන්න කොට්ඨාශයේ මන්ත්‍රීතුමා දැනුවත් කරලා ඒ වීථි ලාම්පු ගලවගෙන එන්න.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

ආයුර්වේද වෛද්‍ය සායනය අපි සෑම වර්ෂයකම ක්‍රියාත්මක කරනවා. මේ වර්ෂයේ ඉඹුල්ගොඩ වසමේ ඉඹුල්ගොඩ විහාරස්ථානයේදී එය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. අවට වසම්වල ජනතාව මේ සඳහා සහභාගී කරවන්න. මන්ත්‍රීවරු සියළු දෙනාටම ආරාධනා කරනවා ආරම්භක අවස්ථාවට සහාභාගී වෙන්න කියලා. මෙය ජනතාව අතර ප්‍රචාරය කරන්න. මොකද වර්තමානයේ ඖෂධ වල මිල ගනන් ඉහල යාම නිසා ජනතාව අපහසුවට පත් වෙලයි සිටින්නේ. ආයුර්වේද බෙහෙත් නොමිලයේ ලබා දෙන නිසා වැඩි දෙනෙකුට මෙය ඉතා ප්‍රයෝජනවත් වේවි.

අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ඡා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වූ උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රිතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තූතිය පල කරනවා.

අද දිනට නියමිත සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 2.30 ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

2022/09/13
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.